රට - දැය - සසුන නැගූ අභීත සිංහනාදය

# අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ

(නොමිලේ බෙදාදීම පිණිසයි)

**රට - දැය - සසුන නැගූ අභීත සිංහනාදය**
**අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ**

ශ්‍රී බු.ව. 2563 බිනර මස පුර පසළොස්වක පොහෝ දින

**සම්පාදනය :** **මහමෙව්නාව භාවනා අසපුව**
වඩුවාව, යටිගල්ඔළුව, පොල්ගහවෙල.
දුර : 037 2244602
Email - info@mahamevnawa.lk
Web - www.mahamevnawa.lk

# සංස්කාරක සටහන

බුදු සමයත්, සිංහල ජාතියත්, හෙළ දැයත් ආගාධයට වැටී තිබූ අවධියක ශ්‍රේෂ්ඨ ජාති හිතෛෂී යුග පුරුෂයෙකු බිහි වී අප්‍රතිහත ධෛර්යයෙන් යළිදු පුනර්ජීවනයක් ඇති කරන ලද්දේය. 'සිංහල ජාතියට පහළ වූ ඍෂිවරයා' යැයි - 'ජාතියේ පියා' යැයි කිව හැකි අවංක වූත් අභීත වූත් ස්වාධීන චින්තනයකින් හෙබි එතුමා වනාහී අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ ය. ලක්දිව පහළ වූ යුගපුරුෂයන් අතර ධර්මපාලතුමා අග්‍රගණ්‍ය වනුයේ රට දැය සමය වෙනුවෙන් අද්විතීය, අනුපමේය, අති උදාර කැපකිරීමක් කළ උතුමෙකු නිසා ය. සිංහල ජාතියත්, සම්බුද්ධ ශාසනයත් නගා සිටුවීම පිණිස බුදු දහමින් ප්‍රභාවත් වූ සිංහල ජාතියේ ප්‍රෞඪත්වය යළි ඉස්මතු කරලීම පිණිස අප්‍රතිහත ධෛර්යයෙන් අභිමානවත්ව සුවිසල් කාර්යයක් එතුමා ඉටු කළ බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

අධිරාජ්‍යවාදී ගැති මානසිකත්වය නිසා සිංහලකමත් - බොදුනුබවත් වල් වදිමින් පැවති අඳුරු යුගයක හෙළ බොදුනුවන්ට ජීවය කවා ප්‍රබෝධමත් කිරීමට ධර්මපාලතුමා දැරූ තැත අතිශයින්ම ප්‍රශස්ත ය. සැබැවින්ම එතුමන් නැගූ අභීත සිංහනාදය නොවන්නට බුදු දහමින් ඔප් නැංවුණු ශ්‍රේෂ්ඨ හෙළ සංස්කෘතියේ අනන්‍යතාවය මුළුමනින්ම වියැකී යන්නට පවා ඉඩ තිබිණි. සිංහල ජාතියේ පිනට බුදු සසුනේ භාග්‍යයට ජනිත අනගාරික ධර්මපාල නම් ඒ උදාර යුගපුරුෂයාණන් නිසා නිදා හුන් ජාතිය යළි පිබිදිණි.

විශිෂ්ඨ දේශකයෙකු මෙන්ම චතුර කථිකයෙකු වූ එතුමා බෞද්ධ පුනර්ජීවනයක් මෙන්ම ජාතික ප්‍රබෝධය ද ඇතිකරලීමට පුරෝගාමී විය. බෞද්ධ අධ්‍යාපනය වර්ධනය

කොට ව්‍යාප්ත කරලීමේ කාර්යයෙහි ද නියමුවෙකු වූ ධර්මපාලතුමා බුද්ධගයාව ඇතුලු දඹදිව උතුම් සිද්ධස්ථානයන් ද යළි පිබිදවීය. අමද්‍යප ව්‍යාපාරය හරහා මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා සදාචාර සම්පන්න සමාජයක් ඇතිකරලන්නට ඇප කැප විය. එමෙන්ම ශිල්පීය දක්ෂතා ඔප්නංවා දේශීය කර්මාන්ත ඇති කරලීමට ද, ජාතියේ ආර්ථික සමෘද්ධිමත් භාවය ඉහළ නැංවීමට ද ක්‍රියා කළේය. එමෙන්ම ගෞතම බුදුරජුන්ගේ ශ්‍රී සද්ධර්මය ජාත්‍යන්තරයට දායාද කිරීමට ද සාධනීය පියවර රැසක් ක්‍රියාත්මක කළේය.

එනමුත් අවාසනාවකට මෙන් එතුමා පැවසූ පරිදි ම නිදහසින් පසු රට කරවූ කලූ සුද්දන් ඒ ශ්‍රේෂ්ඨ ධර්මපාල චින්තනය අමතක කර දැමූහ. බල ලෝභයෙන්, ධන ලෝභයෙන් අදූරදර්ශීව, අමනෝඥ ලෙස වසර 70 ක් පුරා සිදු කරන ලද දුර්දාන්ත පාලනයේ අහිතකර ප්‍රතිවිපාකයන්ට අද මුළු මහත් ජාතිය ම ගොදුරු වී සිටී.

සමස්තයක් වශයෙන් ගත් කළ ජාතියක් තම ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ උතුම් ක්‍රියාවන් පිළිබඳව දැඩි අවධානයක් දැක්විය යුතුය. ඒ වූ කලී හුදෙක් කෙළෙහිගුණ දැක්වීමක් පමණක් නොව, අමිල චරිතයක් ආයෝජනය කිරීමක් ද වේ. ජාතියක් තම අතීත ශ්‍රේෂ්ඨයන්ට දක්වන ගෞරව සැලකිල්ල දැනට ජීවත් වන පරපුර මිනිස් වර්ගයාගේ යහපතත් සුභ සිද්ධියත් පිණිස තම දිවි කැප කරවන්නට ප්‍රබල උත්තේජනයක් සපයයි. ශ්‍රීමත් අනගාරික ධර්මපාල විශිෂ්ඨ චරිතයත් ධර්මපාල චින්තනයත් ඒ පිණිස මහඟු අත්වැලක් සපයමින් පූර්වාදර්ශ සපයයි.

# පොතේ පෙළගැස්ම

01. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා - සංක්ෂිප්ත චරිතාපදානය
02. දෙව් මිනිසුන්ට අපමණ සෙත සැළසූ ගෞතම සම්බුද්ධ ශාසනය. (ධර්මපාලතුමාගේ උතුම් ශාසනික ආකල්ප)
03. සිංහල ජාතියට පහළ වූ ඉසිවරයා (සිංහල ජාතියේ ශ්‍රේෂ්ඨත්වය හා සබැඳි මහාවංශය)
04. හෙළ - බොදු දූවා දරුවන්ගේ යහපත පිණිස ම ධර්මපාල ශ්‍රීමතාණන් ලබාදුන් උපදේශ.
05. ගුරුවරුන් විසින් කටයුතු දේ.
06. හෙළ කතුනගේ සදාචාර සම්පන්න බව පිණිස ම ධර්මපාලතුමාගේ උතුම් ඔවදන් මාලාව.
07. ධර්මපාලතුමාගේ අමද්‍යප සටන (මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙන්, විකිණීමෙන් වළකිමු)
08. ධර්මපාලතුමාගේ විශිෂ්ඨ ආර්ථික දැක්ම. (ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් සහ ශිල්ප ඥානයෙන් යුතු දේශීය අනන්‍යතාවක් උදෙසා ධර්මපාලතුමාගේ හරවත් මඟපෙන්වීම්)
09. සමාජ සුබසාධනය පිණිස ධර්මපාලතුමාගේ මඟපෙන්වීම් (ග්‍රාම සංවර්ධන සමිති මගින් කළ යුතු වැඩ)
10. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ලොවපුරා පතුරුවා හැරීම.
11. අඩසිය වසක් ධර්මපාලතුමා රට - දැය - සමයට සිදුකළ විශිෂ්ඨ සේවාව
12. සිංහල ජාතියේත්, සම්බුද්ධ ශාසනයේත්, ලංකාදීපයේත් අභිවෘද්ධිය පිණිස අනගාරික ධර්මපාලතුමාගේ සොඳුරු අපේක්ෂාවන්.
13. අනගාරික ධර්මපාලතුමා අද සිටියා නම් මෙසේ කියාවි...

# 01

# ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා

## (සංක්ෂිප්ත චරිතාපදානය)

රට - දැය - සමයට මහෝපකාරී වන ශ්‍රේෂ්ඨ ගණයේ උතුමන් පහළ වන්නේ ඉතාමත් කලාතුරකින් නිසා එබඳු උතුමන් හඳුන්වන්නේ යුගපුරුෂයන් කියා ය. 19 වන සියවසේ මැද භාගයේදී එබඳු ශ්‍රේෂ්ඨ ගණයේ යුගපුරුෂයෙකු පුරාකෘත පුණ්‍ය මහිමයෙන් ලක්දිව පහළ වූ අතර ඒ අන් කිසිවෙකු නොව ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ය.

## පින්වන්ත මා - පිය යුවලක් ලබා...

දකුණු ලක මාතර සිට කොළඹට පැමිණ ගෘහභාණ්ඩ සම්පාදනයෙන් මහ ධනවතෙකු ද, බෞද්ධ ප්‍රභූවරයෙකු ද වූ දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමා එතුමන්ගේ පියා ය. සැදැහැවත්, පරිත්‍යාගශීලී උපාසිකාවක් වූ මල්ලිකා හේවාවිතාරණ මැණියන්ගේ කුසින් 1864 සැප්තැම්බර් මස 17 දින උපන් ධර්මපාලතුමාට දොන් ඩේවිඩ් හේවාවිතාරණ ලෙස නම් තැබිණි. මේ සම්භාවනීය බෞද්ධ ප්‍රභූ කුටුම්බිකයේ අනුශාසකයන් වූයේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවා ධර්ම - ශාස්ත්‍රීය ආලෝකය යළි පැතිරවූ පණ්ඩිත ශිරෝමණී හික්කඩුවේ සුමංගල ශ්‍රී පාදස්ථානාධිපති නාහිමිපාණෝ ය. උන්වහන්සේගේ දූරදර්ශී බුද්ධිමත් අවවාද අනුශාසනා ද, සිය ආදර්ශමත් මාපිය යුවලගේ මග පෙන්වීම ද ළමා වියේ ධර්මපාලතුමා ලද ශ්‍රේෂ්ඨ දායාදයෝ වූහ.

## වාසනාවන් කළණ මිතුරු ඇසුර...

එවකට තිබූ සමාජ පසුබිම තුළ ක්‍රිස්තියානි පාසල්වල අධ්‍යාපනය ලැබීමට දොන් ඩේවිඩ් දරුවාට ද සිදුවිය. එනමුත් විද්‍යෝදය පිරිවෙනේ ශ්‍රේෂ්ඨ ආචාර්යවරයන් වහන්සේලා ඇසුරින් සිංහල - පාලි - සංස්කෘත භාෂාවන් ද ත්‍රිපිටක ධර්මය ද මැනවින් හදාරන්නට අවස්ථාව සැලසුණි. පසුකාලීනව සිංහල දේශයත් සම්බුද්ධ ශාසනයත් උදෙසා ඒ සා මහත් විශිෂ්ඨ සේවාවක් ඉටු කරන්නට ගුරු - හරුකම් ලැබුනේ ද ඒ තුලිනි. නිරන්තරයෙන් ම පොත පත කියවීමට දැඩි රුචිකත්වයක් දැක්වූ ඩේවිඩ් හෙවත් ධර්මපාලතුමා ඒ නිසා ම ඉංග්‍රීසි - දෙමළ - හින්දි භාෂාවන් ද ප්‍රගුණ කරගත්තේය.

## හෙළ බොදුනුවන් පුබුදු කළ බොදු පුනරුදය...

ධර්මපාලතුමා උපත ලබන වකවානුව වනවිට ඉංග්‍රීසීන් විසින් 1815 දී ලක්දිව සපුරා යටත් කරගෙන වසර 50 කට ආසන්න ය. පෘතුගීසි - ලන්දේසි - ඉංග්‍රීසි යන යටත්විජිතවාදීන්ගේ බලපෑමට වසර සියගණනක් නතුවීම හේතුවෙන් දේශපාලනික, ආගමික, ආර්ථික, සාමාජීය, සදාචාර යන සෑම අංශයකින් ම සිංහලයෝ මේ අවධියේ පරිහානියට පත්ව සිටියහ.

එසේ නමුදු ශ්‍රී සද්ධර්මයෙහි අකාලික සත්‍යතාවය ප්‍රකට කරමින් බුදු දහමේ යශෝකීර්තිය දසත පතුරුවමින් හෙළ - බොදුනුවන් විසින් විජයග්‍රහණය කළ සුප්‍රකට 'පානදුරාවාදය' සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා මෙරටට කැඳවන්නට සමත් විය. ඇමරිකන් ජාතික ඕල්කට්තුමාත් රුසියන් ජාතික බ්ලැවැට්ස්කි මැතිණියත් ගාල්ල විජයානන්ද පිරිවෙනේදී තිසරණ සරණගත උපාසක - උපාසිකාවන් වීමෙන් අනතුරුව ඇරඹි බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඩේවිඩ් හේවාවිතාරණයන්ගේ දිවියෙහි ද හැරවුම් ලක්ෂයක් ඇති කළේය. සෙන්පති ඕල්කට්තුමා පරම විඥානාර්ථ සමාගම

පිහිටුවා 'සරසවි සඳරැස' පුවත්පත ද අරඹා බෞද්ධ ප්‍රබෝධය උදෙසා ගත් වෑයම තරුණ හේවාවිතාරණයන් තුළ පැවති ජාත්‍යාලයට ද, දේශානුරාගයට ද, ආගමාලයට ද නව ජීවයක් ගෙන දුනි. එම යටත් විජිත යුගයේ ලාංකිකයෙකුට ලද හැකි උසස් ම තනතුරක් වූ අධ්‍යාපන දෙපාර්තමේන්තු ලිපිකරු තනතුරෙන් ද අස්වූ හෙතෙම 1886 දී පරම විඥානාර්ථ සමාග මට බැදුණි. එම සමාගමේ බෞද්ධ අංශයේ ප්‍රධාන ලේකම් ලෙසත්, සරසවි සඳරැස පුවත්පතේ හා බෞද්ධ යන්ත්‍රාලයේ කළමනාකරු හැටියටත්, බෞද්ධ පාඨශාලාවල කළමනාකරු හැටියටත්, බෞද්ධාරක්ෂක සභාවේ සහකාර ලේකම් හැටියටත් අප්‍රතිහත ධෛර්යයෙන් දිවා රෑ නොබලා වෙහෙසෙමින් අනුපමේය සේවාවක් සිදු කළේය.

## අනගාරිකව රට - දැය සමයට දිවි පුදයි..

විසි එක්වෙනි වියේදී හෙවත් 1885 දී ගෘහස්ථ ජීවිතය, සිය පරාර්ථකාමී ජාති හිතෛශී ශාසනික ප්‍රබෝධී අභිමතාර්ථයන්ට බාධාවක් බැවින්, මාපිය ආශිර්වාදය ඇතිව අනගාරික දිවියට පිවිස පාරිශුද්ධ බ්‍රහ්මචාරී දිවියක් ඇරඹීය. එතැන් පටන් ඩේවිඩ් යන පරභාෂික බයිබල් නාමය අතහැර 'ධර්මපාල' යන ආර්ය නාමය භාවිත කරමින් 'අනගාරික ධර්මපාල' නමින් කීර්ති ගුණ ඝෝෂාව දසත විහිදුවීය.

## ලක්දිවින් බිහි වූ අති දක්ෂ කථිකයා..

මේ අවධියේ ධර්මපාලතුමන් කළ ප්‍රමුඛ කාර්යයක් වූයේ ඕල්කට්තුමා සමඟ ලක්දිව පුරා ගමන් කරමින් එතුමාගේ ව්‍යක්ත කථා සිංහලයට පරිවර්තනය කිරීමයි. එම දේශනාවන් මෙන්ම, ගම් නියම්ගම් සිසාරා සිදු කළ සංචාරයේදී අත්දුටු සිංහල බෞද්ධ ජනයාගේ අසරණ, ශෝකී, පරාධීන ස්වභාවය ධර්මපාලතුමාගේ හද කම්පා කළේය. එමෙන් ම සිය හදෙහි ඇවිලෙමින් තිබූ දේශාභිමානී, ශාසනකාමී, අවංක හැඟීම් නව ජවයකින් පුබුදුවන්නට ද එකී අත්දැකීම් සමත් විය. සුදු

අධිරාජ්‍යවාදීන්ගෙන් රට - දැය - සමය මුදවාගෙන ජාතිය ප්‍රකෘතිමත් කිරීමේ පරම අදිටන ධර්මපාලතුමාගේ චිත්ත සන්තානයේ මුල්බැස ගත්තේ එකල ය.

## ජපන් රටට ගිය ධර්ම දූතයෝ...

ජපන් බෞද්ධයන්ගේ ගෞරවණීය ඇරයුම පිට විශේෂ ධර්මදූත ගමනක් ලෙසින් ඕල්කට්තුමා සහ අනගාරික ධර්මපාලතුමා 1889 දී ජපන් රටට ගියහ. එහිදී මිෂනාරී දුර්මත විදාරනය කරමින්, මිෂනාරී බලමුළු දෙදරවමින් දේශනාවන් පැවැත්වූ ඔවුහු ජපානයේ විශිෂ්ට බෞද්ධ පුනරුදයක් ඇති කළහ.

එකල පරම විඥානාර්ථ සමාගම මගින්, බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම පිණිස සිදු කෙරුණු මහත් කාර්යභාරයෙන් වැදගත් කොටසක් ඉටු කෙරුණේ ධර්මපාලතුමන් අතිනි. විශේෂයෙන් ම කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ, ගාල්ල මහින්ද, පන්නිපිටිය ධර්මපාල වැනි ප්‍රමුඛ පෙළේ බෞද්ධ පාඨශාලා ලක්දිව පුරා පිහිටුවීමෙහිලා ධර්මපාලතුමාගෙන් ඉටු වූයේ පුරෝගාමී මෙහෙවරකි.

## දඹදිව සම්බුද්ධ පුණ්‍ය භූමි යළි පුබුදුවයි...

අනගාරික ධර්මපාලතුමන් ශාසනික වශයෙන් කළ උදාර සේවාවෙන් වැඩි ඉඩක් වෙන් කෙරුනේ දඹදිව සම්බුද්ධ භූමීන් සුරක්ෂිත කරලීම පිණිස ය. 1890 දෙසැම්බර් 05 වන දින බුද්ධගයා මහ බෝමැඩ වන්දනා කරන්නට ගිය එතුමා තථාගත වජ්‍රාසනය අභියස නළල තබා වැඳ බුද්ධගයා බෞද්ධ උරුමය සුරැකීම පිණිස දිවිහිමියෙන් කැප වීමට ස්ථිරසාර අධිෂ්ඨානයක් ඇති කර ගත්තේය. එකල බුද්ධගයාවට දානව රාක්ෂසයන් සේ අරක්ගෙන සිටි හින්දු මිසදිටු මහන්තාගෙන් එම ශුද්ධ භූමිය මුදාගෙන, බොදුනුවන්ගේ අයිතියට ලබා ගැනීමට, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම එතුමන් සිදු කළේ දුෂ්කර, දැවැන්ත සටනකි. ඒ පිණිස

බුරුම ප්‍රභූන්ගෙන් ද සහාය ලබා ගත් ධර්මපාලතුමා ඉක්බිති මෙරටට පැමිණ "සිංහලයිනි නැගිටිව්! බුද්ධගයාව බේරා ගනිව්!" යන අභීත නාදය නගමින් ගම් දනව් පුරා සැරිසරමින් හෙළ බොදුනුවන් අවදි කරවීය. එම ශ්‍රේෂ්ඨ ප්‍රයත්නය සඵල කර ගනු පිණිස, 1891 මැයි 31 වනදා, විද්‍යෝදය පිරිවෙනේදී අති ගෞරවාර්හ හික්කඩුවේ සුමංගල නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් 'මහාබෝධි සමාගම' ඇරඹීය. ඕල්කට්තුමා විසින් දළදා වහන්සේට අපහාස වචන ප්‍රකාශ කිරීමක් මූලික කරගෙන, පරම විඥානවාදීන් කෙරෙහි කලකිරුණු ධර්මපාලතුමා ඔවුන්ගෙන් වෙන් වූයේ ද මේ සමයේ දී ය.

## සම්බුදු දහමේ ගුණ සුවඳ අපරදිගට විහිදුවයි...

අනගාරික ධර්මපාතුමාගේ ව්‍යක්ත කථිකත්වයත්, ගැඹුරු ධර්ම ඥානයත් නිසා සම්බුදු දහමේ ගුණ කඳ ජාත්‍යන්තරයට විහිදී ගියේ 1893 සැප්තැම්බර් මාසයේදී අමෙරිකාවේ චිකාගෝ නුවර පැවති දෘෂ්ටි සම්මේලනයේ දී කළ විශිෂ්ට දේශනයෙනි.

එවකට විසිනව හැවිරිදි වියෙහි පසු වූ ධර්මපාලතුමා සම්බුද්ධ චරිතය ද චතුරාර්ය සත්‍යය ද පාදක කරගෙන එහි දී කළ මධුරතර චතුර දේශනය ලෝක විද්වතුන්ගේ ගෞරවණීය සුවිශේෂී අවධානය බුදු දහම කෙරෙහි ඇදබැඳ ගැනීමට සමත් විය.

## සම්බුද්ධ භූමියට කළගුණ පුදයි...

බුද්ධගයාවෙහි පමණක් නොව සමස්ත දඹදිව ම සම්බුද්ධාලෝකය පතුරුවා හැරීමෙහි නියුක්ත වූ ධර්මපාල ශ්‍රීමතාණන් බරණැස ඉසිපතනයේ මූලගන්ධ කුටි විහාරය ද කල්කටාවේ ධර්මරාජික විහාරය ද ඉදිකරවා බුදු සසුනට පිදීය. තව ද බුද්ධගයාවේත්, මදුරාසියේත් බෞද්ධ විශ්‍රාම ශාලා ද ගොඩ නැගුවේ ය. එමෙන් ම දිල්ලිය, බොම්බාය, සාංචිය, ලක්නව් ආදී නගරවල ද මහාබෝධි මධ්‍යස්ථාන පිහිටවූ අතර එමගින් දඹදිව වන්දනාවේ යෙදෙන ලෝවාසී

බෞද්ධයන්ට උදාවන්නේ මහත් සැනසිල්ලකි. එමෙන් ම භාග්‍යවතුන් වහන්සේගේ සදහම් සන්දේශය පතුරුවා හැරීම පිණිස ධර්මදූතයන් ලෙස සාමණේරයන් වහන්සේලා පුහුණු කිරීම ද එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය ඇරඹීම ද එතුමාගේ සුවිශේෂී ශාසනික කර්තව්‍යයන් ය.

## සිංහල ජාතියට පහළ වූ ඉසිවරයා...

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් සිංහල ජාතිය උදෙසා සිදු කළ මහානීය මෙහෙය නම් අධිරාජ්‍යගැති පරාධීන චින්තනයෙන් මුදවා, සිංහල ජාතියට සිය ප්‍රෞඪ ඉතිහාසයත්, අභිමානවත් හෙළ පරපුරේ යශෝරාවයත් සිහි කර දී අදීන ජාතියක් බිහි කිරීමට කළ දැවැන්ත ආකල්පමය පරිවර්තනය යි. මෙම චින්තන විප්ලවය උදෙසා එතුමන් යොදා ගත් සාධනීය ප්‍රබල ප්‍රවේශයක් වූයේ 1908 මැයි මස ආරම්භ කළ 'සිංහල බෞද්ධයා' සතිපතා පුවත්පත යි. එහි ප්‍රධාන කර්තෘ පදවිය හොබවමින් සිංහල බෞද්ධයාගේ භෞතික ආධ්‍යාත්මික සමෘද්ධිමත් බව පිණිස ද මෙලොව පරලොව යහපත පිණිස ද අනර්ඝ උපදේශන මාලාවක් සැපයුවේය.

ජාතිය, ශාසනය, සදාචාරය, ආර්ථිකය ආදී සියලු ම වැදගත් ක්ෂේත්‍රයන් සංවර්ධනය කොට සුරක්ෂිත කළ යුතු ආකාරය පිළිබඳ විශිෂ්ට දැක්මක් ධර්මපාලතුමා එළි දැක්වූයේ සිංහල - බෞද්ධයා පුවත්පතේ 'දැනගත යුතු කරුණු' විශේෂාංගය තුළින් ය. එමෙන් ම ඉතා හරවත් වූ එම න්‍යායන් හැකි උපරිම අයුරින් සමාජගත කිරීමට ද ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට ද අඩ සියවසක් පුරා එතුමා ඇපකැප විය.

## දේශය අවදි කළ කාහල නාදය...

ජාතිය නගා සිටුවීමේ යුග මෙහෙවරේ දී ධර්මපාලතුමා භාවිත කළ අනෙක් සාධනීය ක්‍රමවේදය වූයේ ලක්දිව ගම් දනව් සිසාරා සැරිසරමින් කාහල නාදයක් බඳු සිය දේශනා චතුරත්වයෙන් සැම සිත් වසඟ කරමින් අනුශාසනා කිරීම යි.

1912 දී ඇරඹි පරාර්ථකාමී මේ සත්කාර්යයය සඳහා 'ශෝභන මාලිගාව' නම් විශේෂිත රථය යොදා ගැනුණි. යහපත කැමති දයාබර පියෙකු සිය දරුවන්ගේ නොපනත්කම් දැක තරවටු කරන්නා සේ, තත්කාලීන සිංහල ජනයාගේ නිවට, නියාලු, බියගුලු, අලස ගති දුරලීමටත්, අභිමානවත්, සදාචාර සම්පන්න දූරදර්ශී 'සිංහල - බෞද්ධයන්' බිහි කිරීමටත් එතුමා තරාතිරම නොබලා වචන නමැති අසිපතින් සැමට ම පහර දුන්නේය. සැර පරුෂ වුව ද අවංක යහපත් චේතනාවෙන් සිදු කළ එම දෙසුම් නිසා නින්දෙන් පිබිදි සිංහලයා සංකර, පරගැති සිරිත් අතහැර දමා සිංහල ඇඳුම් අඳින්නටත්, සිංහල නම් භාවිත කරන්නටත්, සිංහල බෞද්ධයන් ලෙස සිතන්නටත් හුරු පුරුදු වූහ. මෙය ධර්මපාල ශ්‍රීමතාණන් නිසා ම සිදු වූ චින්තන විප්ලවයක් බව පැවසීම අතිශයෝක්තියක් නො වේ.

## ආර්ථික සමෘද්ධිය පිණිස ධර්මපාල දැක්ම...

ජාතියක් ස්වාධීන වන්නට නම්, ආර්ථික සමෘද්ධිමත් භාවය ද අත්‍යවශ්‍ය සාධකයක් බව මැනවින් පසක් කළ ධර්මපාලතුමා ශිල්පීය ඥානය ඉහළ නංවන්නට ද දේශීය කර්මාන්ත සංවර්ධනයට ද මංපෙත් විවර කළේ ය. සිංහල තරුණයන්ට ශිෂ්‍යත්ව ලබා දී ජපානයට යවා පේශ කර්මාන්තය, ගිනි පෙට්ටි කර්මාන්තය, පෝසිලේන් පිඟන් සෑදීම ආදී ශිල්පීය පුහුණුව ලබා දුන්නේය. එමතු ද නොව ඔවුන් පුහුණුව ලබා ආපසු ඒ ඒ ක්ෂේත්‍රයන්හි කර්මාන්තශාලා අරඹා ආර්ථිකය සවිමත් කරවන්නට ද කටයුතු සැලැස්වී ය.

## මව්බිමෙන් සමුගෙන දඹදිව්තලය කරා...

අඩ සියවසකට ආසන්න කාලයක් රට දැය සමය නගන්නට අප්‍රතිහත ධෛර්යයෙන් දිවා රෑ නොබලා දැවැන්ත යුග මෙහෙවරක් ඉටු කළ ලක්මාතාව ජනිත කළ මේ අති ශ්‍රේෂ්ඨ පුත්‍ර රත්නය 1931 දී මාතෘභූමියෙන් සමුගත්තේය. කොළඹ විද්‍යෝදය පිරිවෙනේ දී ගිහි - පැවිදි පිරිසට මෙරට

දී අවසන් දේශනය පැවැත්වූ ධර්මාපලතුමා තමන් භාරයේ පැවති සියලු වත්කම් ජාතික - ශාසනික උන්නතිය පිණිස පොදු කමිටුවකට පවරා ගෞතම බුදු සසුනේ උතුම් පැවිදි බව ලබන අපේක්ෂාවෙන් සම්බුද්ධ භූමිය බලා පිටත්ව ගියේ ය. එම වසරේ දී ම සිරි දේවමිත්ත ධම්මපාල නමින් උතුම් පැවිදි බව ලබා, 1933 ජනවාරි දහසය දින බරණැස ඉසිපතනයේ මූලගන්ධ කුටි විහාරයේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ. එවකට ලක්දිව වැඩ සිටි ධර්මධර - විනයධර ශ්‍රේෂ්ඨ යතිවරයන් වහන්සේලා වසර 700කට පමණ පසු දඹදිව සිදු වූ ඒ උත්කෘෂ්ට විනය කර්මයට සහභාගී වීම පිණිස එහි වැඩම කළහ.

## සත්පුරුෂයන් ලෙස කෙළෙහිගුණ දක්වමු...

ජාතිය - ශාසනය වෙනුවෙන් සිය දිවිය ම කැප කළ ඒ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයාගේ - ජාතියේ පියාණන්ගේ අනගාරික ධර්මපාලතුමාගේ උදාර ගුණ සම්පත්තිය අප නිරන්තරයෙන් සිහිපත් කළ යුතු ය. සිංහල ජාතියට පහළ වූ ඉසිවරයාට කෙළෙහිගුණ දැක්විය යුතු ය. ඒ ශ්‍රේෂ්ඨ ධර්මපාල චින්තනය හැකිතාක් සමාජගත කළ යුතු ය. ඒ දූරදර්ශී අදීන නිවහල් චින්තනය සෑම කෙනෙකු ම සෑම අංගයකින් ම ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවිය යුතු ය. එතුමන් බලාපොරොත්තු වූ පරිද්දෙන් ම සිංහල ජාතියත්, සම්බුද්ධ ශාසනයත් උද්දීප්තියට පත් කරවා ගෞතම සම්බුද්ධ සන්දේශය ලොව පුරා පතුරුවා හැරිය යුතු ය. අනගාරික ධර්මපාලතුමාගේ හෘදයාංගම වදන් පෙළක් වූ "සිංහල ජාතිය සුරැකේවා", "සම්බුදු සසුන බැබළේවා" යන්න යථාර්ථයක් වන්නේ එවිට පමණි.

# 02

# දෙව් - මිනිසුන්ට අපමණ සෙත සැළසූ ගෞතම සම්බුද්ධ ශාසනය

## (ධර්මපාලතුමාගේ උතුම් ශාසනික ආකල්ප)

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා හදවතින් ම තෙරුවන් සරණ ගිය, සැදැහැවත් ශ්‍රාවකයෙකි. බ්‍රහ්මචාරී සීලය ද සමඟින් පිරිසිදු, නිකැළැල් සීලයක් රැකි සැබෑම සිල්වතෙකි. ලංකාවේ අනාගතය දිවැසින් මෙන් දුටු ඉසිවරයෙකි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ සදහම් සංදේශය ලොව පුරා පතුරුවා හැරි ව්‍යක්ත ධර්ම කථිකයෙකි. බුද්ධගයාව ප්‍රමුඛ සම්බුද්ධ භූමීන් යළි ගොඩනැගූ වෙහෙර විහාර ඉදිකළ සත්ගුණවත් දායක පින්වතෙකි. බෞද්ධයන් අතර පුනර්ජීවනයක් ඇතිකළ ලංකා මාතාව බිහිකළ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යරත්නයක් වූ අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ අව්‍යාජ සැදැහැති ආකල්ප සම්පත්තියෙන් බිඳක් මෙසේය;

- "බුද්ධ චරිතය සම්පූර්ණ වශයෙන් දැනගැනීමට යමෙකු සම්පූර්ණ ත්‍රිපිටකය කියවීම අවශ්‍ය ය. මේ හැම සූත්‍රයක ම බුද්ධත්වයේ සිට අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑම දක්වා වූ තථාගතයන් වහන්සේගේ කාර්යබහුල ජීවිතය හෙළි කරනු ලැබ ඇත. බුදුරදුන් හැඳිනගන්නට නම් උන්වහන්සේගේ ධර්මය දත යුතුය."
- "බුදුරදුන් වදාළ චතුරාර්ය සත්‍යයේ ස්වභාවය වටහා ගැනීමට නම් ත්‍රිපිටක ධර්ම අවබෝධයෙන් යුතුව හැදෑරීම කළ යුතුව ඇත. යමෙක් ධර්මය දකී ද, හේ බුදුරදුන් දුටුයේ නම් වෙයි."

- "ලෞකික කෘත්‍යයෙහි හැසිරීමට පටන්ගත් තැන් පටන් භික්ෂූන්ගේ සීල ශුද්ධිය අඩුවීමට හේතු වේ. භාවනාවෙහි හැසිරෙන, මෛත්‍රිය වර්ධනය කරන භික්ෂූන්ගේ වැඩිවීම කෙතරම් ද, ඒ පමණට රටට ජාතියට ද වැඩ වේ."
- "හොඳින් ධර්මය ඉගෙන ගන්නවා නම් ශ්‍රද්ධාව උපදිනවාට සැක නැත. මම දිවා රෑ දෙකෙහි ම ධර්මප්‍රකරණ භාවිතා කරන නිසා දවසින් දවස මගේ ශ්‍රද්ධාව දියුණු වන්නේය."
- "සියලු දුකට මුල අඥානකම යි. සියලු පව් කිරීමට මුල මිත්‍යාදෘෂ්ටිය යි. ප්‍රඥාව ලබාගැනීමට බලවත් වීර්ය ඇතිකර ගත යුතුයි. කුසීත හීන වීර්යය ඇති පුද්ගලයාට ප්‍රඥාව කිසි කලෙක ලබාගන්නට නොහැකියි. තවද, ධර්මය දැනගෙන බණ භාවනා කටයුතුයි. සත්තිස් බෝධිපාර්ශ්වික ධර්මයන් දැනගත් විට කිසි කලෙක අලසකමින් සිටින්නට සිත නූපදී."
- "මෛත්‍රී භාවනාව නොකරන නිසා ඊර්ෂ්‍යා, ක්‍රෝධ සිතෙහි උපදී. නිතරම මෛත්‍රිය වඩනු. හීන වීර්යය අත්හැර ආරබ්ධ වීර්යය වඩනු. පවිත්‍රකම දියුණු කරගනු. බාහිර වස්තු පවිත්‍රව තබාගනු."
- "ලංකාවේ පාලි - සිංහල දන්නා භික්ෂූන් විසින් පාලි ග්‍රන්ථ සිංහලයට පරිවර්තනය කිරීම අප්‍රමාදව කටයුතුයි."
- "ස්ථවිර භික්ෂූන් විසින් පරාර්ථය පිණිස පාලි ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කිරීම මහා කුසල කර්මයක් යැයි සළකා කටයුතු කළයුතුයි. මේ මහා පුණ්‍ය කර්මය උභයාර්ථ සිද්ධිය පිණිස වේ. බෞද්ධයන්ට ධර්මය දැන ගැනීමට මෙය මගක් වේ."
- "උපාසක ධර්මය හොඳින් රක්ෂා කරනු. ශ්‍රද්ධා, ශ්‍රැත, සීල, ත්‍යාග, හිරි ඔත්තප්ප යන ආර්ය ධනය රැස්කර ගනු."

- "තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද පාරිශුද්ධ නිර්මල නෛර්යානික ධර්මයේ අන්දමට යම් පුද්ගලයකු එය පිළිපදී ද, ඔහුට මේ ජීවිතයේදී ම එහි ඵල සාක්ෂාත් කිරීමට පුළුවන. ප්‍රථම කොට මේ ධර්මය ඉගෙනගත යුතුයි. ධර්මය ඉගෙන ගැනීමට සත්පුරුෂ ධර්මය දැනගත් භික්ෂූන් වහන්සේලා සේවනය කටයුතුයි."

- "පඤ්චසීලයෙහි පිහිටා දස අකුසලයෙන් වෙන්වී, ආත්මාර්ථ-පරාර්ථ යන උභයාර්ථය පිණිස දිනෙන් දින ම වීර්යය කටයුතුයි."

- "සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී ධර්මයන් පුරා මහාභිනිෂ්ක්‍රමණය කොට සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාකොට ප්‍රධන් වීර්යය උපදවා සර්වඥතා ඥානය ලැබ ශාක්‍යසිංහ ගෞතම මුනීන්ද්‍රයන් වහන්සේ සකල ක්ලේශයන් නැති කිරීමට ගත් වීර්යය ප්‍රමාණ කළ නොහැකියි."

- "දුර්වල වී සිටින සිංහලයන් සමඟිව පංච දුශ්චරිත ක්‍රියා අත්හැර දමා සමඟිකමින් ක්‍රියාකරන්නටත්, බුදුරජාණන් වහන්සේ අපේ ශාස්තෘන් වහන්සේ ය, අපේ කල්‍යාණ මිත්‍රයා ය, අපට අනුකම්පාවෙන් ධර්මය දේශනා කළේ ය, අපි උන්වහන්සේගේ ධර්මයට කීකරුව සමඟිකම වර්ධනය කරමින් අපේ රට, අපේ ජාතිය, අපේ භාෂාව සමෘද්ධ භාවයට පමුණුවන්නට උත්සාහ කළ යුතුයි."

- "අපරිහානීය ධර්ම පුරුදු කරනු! තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ලිච්ඡවී රජුන්ට වදාරණ ලද සප්ත අපරිහානීය ධර්ම මහාපරිනිබ්බාන සූත්‍රයෙහි දක්වා ඇත. ලිච්ඡවී රාජධානියේ වජ්ජීන්ට දේශනා කරන ලද සප්ත අපරිහානීය ධර්ම මෙකල සකල බෞද්ධ ස්ත්‍රී - පුරුෂ, ලොකු - කුඩා සිංහලයන් විසින් සිත්හි දරාගෙන සියලු කටයුතු කළ යුතුයි.

- මේ ධර්ම සත බෞද්ධ පාඨශාලාවල බාලක බාලිකාවන්ට ඉගැන්විය යුතුයි. මේ ධර්ම ලිඛිත කොට හැම පාඨශාලාවල එල්ලා තැබිය යුතුයි. ධර්මාසනාරූඪ වූ භික්ෂූන් විසින් සප්ත අපරිහානීය ධර්මය, ධර්මය ඇසීමට පැමිණි පිරිසට ප්‍රකාශ කටයුතුයි. මේ ධර්ම අන්තර්ගත පත්‍රිකා මුද්‍රණය කොට බෞද්ධයන් අතර බෙදා හැරිය යුතුයි. බාල කාලයේ සිට මේ ධර්මයට අනුව පිළිපැදීමට පළමු කොට බෞද්ධ දරුවන්ට දෙගුරුන් ඉගැන්විය යුතුයි. යාම් ඊම්, ඉඳීම් හිටීම් කරන විට මේ ධර්ම ස්මරණය කිරීමට බෞද්ධයන් විසින් සිත්හි දරාගත යුතුයි."

- "භාග්‍යවතුන් වහන්සේ වදාළ සාරාණීය ධර්ම සය භික්ෂූන් විසින් පුරුදු කටයුතුයි. මේ කාලයට ඕනෑ කරන්නේ මෛත්‍රී වර්ධනය යි. මෛත්‍රී සිතින් කාය - වාග් - මනෝ කර්ම භික්ෂූන් විසින් හැම කල්හි ම කරනු ලැබේ නම් අසමඟිය නැති වේ. මේ කාලයේ භික්ෂූන් සමඟියෙන්, ඒකීයභාවයෙන් සම්මෝදමානයෙන්, අවිවදමානයෙන්, ඛීරෝදකීභූත භාවයෙන් සියලු ශාසනික කටයුතු කළයුතුයි."

- "සතියක් පාසා 'සිංහල බෞද්ධයා' පත්‍රයට 'දැනගත යුතු කරුණු' හිසින් මා ලිපි ලියන්නේ රාත්‍රී 2ට නැඟිට ලෝකානුකම්පාවෙන් වීර්යය මුල්කරගෙන ය. බොහෝ දෙනා සැපසේ නිදන කාලයේ මා මෙසේ ගතකරන්නේ මහා කාරුණික තථාගතයන් වහන්සේගේ චරිතය ආදර්ශ කරගත් නිසාය."

- "බොහෝ රටවල ඇවිදින මා සර්වඥ ධර්මය උතුම් බව ප්‍රකාශ කරන්නේ අනෙක් ශාස්තෘන්ගේ මත විභාග කරමින් තථාගත වචනයට සසඳා බලා තථාගත ධර්මය ශ්‍රේෂ්ඨ නිසයි."

- "මෛත්‍රී භාවනාව කිරීමෙන් මගේ හිතට සැප ලැබේ. බුදුගුණ සිහිකරමින් නිතර ධර්මය මෙනෙහි කරමින් කල් යවමි."
- "තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ස්වයම්භූ ඥාණයෙන් දැනගත් 'පටිච්ච සමුප්පාද' ධර්මය මනාකොට දැනගැනීම මහා ප්‍රාඥයින්ටත් අමාරු වුවත් උත්සාහ වඩා එය දැනගැනීම මහෝපකාරයි."
- "ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය අවබෝධකර ගැනීමට හැමදෙනා විසින් වීර්යය කටයුතුයි."
- "බ්‍රහ්මචරියාව ශ්‍රේෂ්ඨ චරියාව හැටියට පිළිගත යුතුයි. වස්තුකාම ක්ලේශකාමයන්ගෙන් ද සප්තවිධ මෛථුන ධර්මයෙන් ද විරහිතව ආර්ය මාර්ගයේ ගමන් කිරීම ශ්‍රේෂ්ඨ වූ චරිතය යි. බාල කාලයේ පටන් මේ ධර්මය භාවිත කිරීම ප්‍රණීත විඥ්ඥාණයක් ඇතිවීමට හේතු වේ."
- "ලෝකනායක තථාගත සම්බුදුරජාණන් වහන්සේ තුන්වරක් මේ ද්වීපයට වැඩි සේක. එබැවින් ලංකාව ධර්මද්වීපයක් විය. පිරිනිවන් මංචකයේ වැඩහුන් භාග්‍යවත් බුදුරජ තෙම ලංකාව සිහිකොට ශක්‍ර දේවේන්ද්‍රයාට ලංකා ශාසනය භාර කළ සේක."
- "බුද්ධාගම නිර්මලව පැවතුණු කාලයේ ලංකාව සශ්‍රීක උද්‍යානයක් මෙන් ද, මංගල ගෘහයක් මෙන් ද පැවතුණේය. ප්‍රාණඝාතය, අදත්තාදානය, සුරාපානය යනාදී පව් නොකොට මෛත්‍රිය පතුරවමින් අන්‍යෝන්‍ය මිත්‍ර ධර්මය පෙන්වමින් සිංහල ජනකාය ලංකා භූමියෙහි සුවසේ විසූහ."
- "නා නා රටවල සංචාරය කරමින් නා නා ජාතිකයන්ගේ චාරිත්‍ර ධර්ම විභාග කරමින්, ඒ රටවල පණ්ඩිතයින් ආශ්‍රය කරමින් ඔවුන්ට ශ්‍රී සද්ධර්මය ප්‍රකාශ කරමින් තථාගතයන් වහන්සේගේ අත්‍යුත්තම ස්වභාවය මවිසින්

ප්‍රත්‍යක්ෂ කළෙමි. මෙදා ලංකාවට පැමිණි කළ සිංහල බෞද්ධයන්ට වී තිබෙන විපත්ති දැක ඒ විපත්වලින් බේරීමට මඟ මේ යයි කියාදෙන්ට මට සිතක් පහළවුණු බැවින් 'දැනගත යුතු ධර්ම' යන මාතෘකාවෙන් බුද්ධ වචන මුල්කරගෙන සිංහලයන්ගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කොට සතියක් පාසා අවවාද අනුශාසනා කළෙමි."

- "දඹදිව ශාසනික වැඩ ආරම්භ කළ තැන් පටන් මේ දක්වා ලංකාවේ බොහෝ ගිහි පැවිදි පිරිස මට විරුද්ධව ක්‍රියාකර තිබේ. දසදහස් ගණන් කුඩා පොත් මට විරුද්ධව මුද්‍රණය කොට කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ මහතුන් විසින් විසුරුවා හරින ලදී. මට විරුද්ධව නොයෙක් උපක්‍රම කළ හින්දු මහන්තා කෙරෙහිවත් අනිත් අය කෙරෙහිවත් මම ක්‍රෝධ නොකළෙමි."

# 03

# සිංහල ජාතියට පහළ වූ ඉසිවරයා

## ජාතියේ පියා යැයි අබිමන් ලද ධර්මපාලතුමාගේ ජාති වාත්සල්‍යය

වර්ෂ දෙදහස් පන්සියයකට පෙර තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලංකාවට පළමුවෙන් වැඩියේ දුරුතු මස පුර පසළොස්වක දිනයේ ය. ඒ දිනය ස්මරණය කළවිට බෞද්ධ ජනතාවගේ සිත් ප්‍රමෝද වන්නේය. අපගේ සිංහල ජාතියේ ආදිපුරුෂයා වූ විජය කුමාරයා ලක්දිවට ගොඩබට දිනට වසර 45 කට ප්‍රථමයෙන් තථාගතයන් වහන්සේ ලක්දිවට වැඩි සේක. උන්වහන්සේට ඥාති වූ ශාක්‍ය වංශයේ කුමාරවරු මේ රට මනුෂ්‍යවාස වූ පසු පළමුවෙන් පාලනය කළෝය. රටේ රාජ්‍ය නීතිය පිහිටුවන ලද්දේත් ශාක්‍ය මෞර්ය වංශ දෙකේ කුමාරවරුන් විසින් ය.

## සිංහල ජාතියේ ශ්‍රේෂ්ඨත්වය හා සබැඳි මහාවංශය

- "සිංහලයෝ කියන්නේ කව්ද කියා දැනගැනීම ඉතාමත්ම වැදගත් කරුණකි. ස්වකීය ජාතිය ගැන කාරණා දැන ගැනීම රටට සහ ජාතියට ආලයක් ඉපදීමට හේතු වේ. රටට ඇල්මක් උපදින්ට නම් ඉතිහාස කථා කියවිය යුතුයි. ලංකා කථාව අන්තර්ගත මහාවංශය කියවීමෙන් අපේ ජාතියට මා තුළ මහත් ආසාවක් උපන්නේය."
- "ආදි සිංහලයෝ දඹදිව වංග දේශයේ ලාටරට සිංහපුරෙන් විජය කුමාරයාත් සමඟ පළමුවෙන් ලංකාවේ තම්මැන්න

අඩවියට පැමිණියේ යයි සිංහල මහාවංශය නම් ඓතිහාසික ග්‍රන්ථයේ සඳහන්කර තිබේ.”

- “ආදි සිංහලයන්ගේ හටගැන්ම දැනගැනීමට මහාවංශය, දීපවංශය, සමන්තපාසාදිකාව, මහාවංශ ටීකාව, සිංහල මහා අර්ථ කතාව යන නමින් තිබෙන ග්‍රන්ථ කියවිය යුතුයි.”

- “ජම්බුද්වීපයේ පැවතුණු අති ශ්‍රේෂ්ඨ වූ, අති පෞරාණික වූ, ඉතිහාසගත වූ ආර්ය වංශයට නුඹලා අයිති ය. සිංහලයන්ගේ මුත්තෝ බෙන්ගාලේ සිංහපුරයෙන් මෙහි පැමිණියෝය. යුෂ්මතුන්ගේ තේජවත් මුතුන්මිත්තෝ ස්වෛරී දේශවාත්සල්‍යය අවුරුදු 2358ක් තිස්සේ රැකගත්තෝය. අපි වනාහී පරාජිත ජාතියක් නොවම්හ. අපට අපේ උතුම් වූ ශ්‍රේෂ්ඨ වූ ආගම තිබේ. දළදා මන්දිරය වනාහී අසහාය ලෝකනාථ සම්‍යක් සම්බුද්ධ තථාගත ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී දංෂ්ඨා ධාතුව සුරක්ෂිත කොට තබාගෙන තිබෙන රත්න භාණ්ඩාගාරය වේ. අපේ නෛර්යාණික ආගම ධර්මය හොඳින් අදහන තුරුම අපේ ජාතිය නොනැසී පවත්නේය. ලෝකයේ තිබෙන අති පෞරාණික ශ්‍රේෂ්ඨ ආගම ආරක්ෂා කරන්නෝ අපි වම්හ. සිංහල අපි තථාගතයන් වහන්සේගේ නෛර්යාණික ශාසනය අවුරුදු දෙදහස් ගණනක් ආරක්ෂා කරගතිමු. අපේ ධනයත්, අංග ප්‍රත්‍යංග සහ ජීවිතත් පවා පරිත්‍යාග කිරීමෙන් අපේ උතුම් ආගම ආරක්ෂා කරගැනීම අපේ අසහාය යුතුකමකි.”

- “වර්ෂ දෙදහසකට වැඩි කාලයක් දේවාතිදේව, බ්‍රහ්මාතිබ්‍රහ්ම, ශක්‍රාතිශක්‍ර, තුන්ලෝකාග්‍ර භාග්‍යවත් සර්වඥරාජෝත්තමයන් වහන්සේගේ ශාසනය සිංහල බෞද්ධයන් විසින් ආරක්ෂා කළෝය. මෙවැනි ශ්‍රේෂ්ඨ කෘත්‍යයක් පෘථිවි මණ්ඩලයේ අන්‍ය කිසි ජාතියක් විසින් නොකරන ලද්දේය.”

- "මහාවංශය කියවීමෙන් අපට බොහෝ ප්‍රයෝජන වෙනවාට කිසිම සැකයක් නැත. ලංකාවේ රජ කළ දේවානම්පියතිස්ස රජුගේ කාලයේදී දඹදිව රජ කළ ධර්මාශෝක රජුගේ පුත්‍ර වූ මහා මහේන්ද්‍ර ස්ථවිරයන් විසින් ලක්දිවට බුදු දහම ගෙනා බව කවුරුත් දනිති. ඒ උත්තම සර්වඥ ශාසනය ලංකාවේ පිහිටෙව් නිසා සිංහල ජාතිය විනාශ කරන්නට නුපුළුවන්ව තිබේ. ඒ සර්වඥරාජෝත්තමයාගේ බලය නිසා අපට බොහෝ ප්‍රයෝජන ලැබී තිබේ. සර්වඥයන් වහන්සේ වදාරා තිබෙන්නේ තමාගේ යහපත් ශීලයක් තිබේ නම් එය කාටවත් වෙනස් කළ නොහැකි බවයි. ඒ උත්තමයාගේ ධර්මය පිළිපැදීමෙන් අපට දියුණු ස්වභාවයකට පැමිණිය හැකිය."
- "කාලිංග දේශයේ එක්තරා පර්වත ගුහාවක තිබී සොයාගන්නා ලද ලිපියක කාලිංග රජකෙනෙකුගේ යුද්ධාරම්භයක් සටහන්කර තිබේ. මේ ලිපිය විභාගකොට, යුරෝපීය පණ්ඩිතයන් විසින් පිළිගත් බුද්ධ වර්ෂය නොව, මහාවංශයේ දක්වා තිබෙන බුද්ධ වර්ෂය ශුද්ධ යයි ප්‍රකාශ කරන ලදී. මගධ ජාතික ජයස්මාල නම් යුරෝපීය ශාස්ත්‍ර දත් ප්‍රාචීන, පණ්ඩිතයෙක් විසින් ද මහාවංශයේ දක්වන ලද බුද්ධ වර්ෂය ශුද්ධ යයි ප්‍රකට කළේය. මහාවංශය අති ශුද්ධ ග්‍රන්ථයක් බවට අසෝක ශිලා ලිපි සාක්ෂි යි."
- "පුරාණ ලාංකික රාජරාජමහාමාත්‍යාදීන් ආගම දියුණුව පරමාර්ථ කරගෙන ක්‍රියා කළ බව මහාවංශයෙන් පෙනේ. රජවරු යුධ කළෙත් බුද්ධ ශාසනය ආරක්ෂා කරගැනීම පිණිස යි. දේවානම්පියතිස්ස රජතුමා පටන් අවුරුදු දෙදාහක් පමණ කාලයක් සිංහලයෝ කිසි විධියකින් අන්‍ය රජවරුන්ට වහල් නොවූහ. සිංහලයන් වික්‍රමකම් කර තිබෙන බව මහාවංශයෙන් පෙනේ."
- "මහාවංශය භාවිතා කිරීමෙන් සිංහල ජාතිය කෙරෙහි

ප්‍රේමයක් හටගැනීමට හේතු වේ. ඒ නිසා මහාවංශය දැනට හැදෙන පරම්පරාවේ ඇත්තන්ට කියාදීම ඉතාම යෝග්‍ය යි.”

- “ශුභසීහ නම් රජතුමා විසින් හේමමාලා නමැති ස්වකීය දූ කුමරිය සහ බෑණනුවන් වන දන්ත කුමාරයාට තමන් විසින් රක්ෂා කරන ලද ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ භාරකොට ඒ ධාතූන් වහන්සේ සිංහල රජාණන් අතට දෙන්ට නියම කළේය. ශ්‍රී මේඝවර්ණ රජතුමා ලංකා රාජ්‍යය පාලනය කරන කාලයේ දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කළ සේක. එතැන් පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජ කාලය දක්වා වර්ෂ 1403ක් සිංහල නර ශ්‍රේෂ්ඨයන් විසින් ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට පූජා සත්කාර කරන ලදී.”
- “ලංකා ඉතිහාසය වූ මහාවංශය කියවීමෙන් සිංහලයන්ගේ තේජස දැකගැනීමට පුළුවන.”
- “පුරාණ සිංහලයන්ගේ ශ්‍රේෂ්ඨ චාරිත්‍රාදිය දැන ගැනීමට සද්ධර්මාලංකාරය කියවිය යුතුයි. විහාර මහා දේවියගේ ශ්‍රේෂ්ඨ චරිතය සියලු බෞද්ධ ස්ත්‍රීන් විසින් ඉගෙන ගත යුතුයි. අපේ දුටුගැමුණු රජතුමාගේ කථාව බෞද්ධ දරුවන්ට කියාදීම යුතුයි. ඒ රජතුමා ගැන තොරතුරු දැනගැනීමෙන් සිංහලයන්ගේ සිත් ප්‍රබෝධ වේ ම ය.”
- “ස්වකීය රට කෙරෙහි ද, ස්වකීය ජාතිය කෙරෙහි ද, ස්වකීය භක්තිය කෙරෙහි ද ප්‍රේමයක් නැති මනුෂ්‍යයා-ගෙන් ලෝකයට ඇති ප්‍රයෝජන කිම් ද? **ආත්මාර්ථය පමණක් සලකන පරාර්ථය නොසලකන තැනැත්තා රට කෙරෙහි ප්‍රේමයක් දැක්වීම උගහටයි.**”
- “සිංහල ජාතිය වෘද්ධිභාවයට පමුණුවා ගැනීමට ගිහි පැවිදි දෙකොටස ම සමගිකමින් සමාදානයෙන් ඒකීය භාවයෙන් ක්‍රියා කටයුතුයි.”

- "රට කෙරෙහි ආලය ඇති සිංහලයෝ උගතුන් අතරේ කොපමණ සිටින්නේ ද? යම්තම් ඉංග්‍රීසි ටිකක් දැනගත් පමණින් අප රටවාසී සිංහලයෝ සිංහලකම අත්හරිති. පුරාණ සිරිත්, චාරිත්‍ර, කුල පරම්පරා සිරිත් අනුව නොගොස් ජනයාට යෝග්‍ය නොවන්නා වූ විපර්යාස සිරිත් භජනය කරති. විදේශයන්ට ගොස් ඉගෙන ලංකාවට පැමිණ සිටින සිංහලයන්ගෙන් කොපමණ දෙනෙක් රට ගැන ආලයකින් ක්‍රියා කරන්නේ ද? ලංකාවේ සිටින ධනවත් මහතුන්ගෙන් කොපමණ දෙනෙක් ස්වජාතිකයන්ගේ දියුණුව පරමාර්ථ කරගෙන ධනය වියදම් කර තිබේද? ලෞකිකාර්ථය සහ ජීවිතාර්ථය පමණක් සලකා ඇතැම් අය ධනය වියදම් කරයි. එයින් ලෝකයාට ලැබෙන අර්ථය කවරේද?"
- "ධනවත් සිංහල තරුණ මහතුන් විසින් ස්වකීය ධනය අනර්ථයේ වියදම් නොකොට ආර්ය සිංහල ජාතිය දියුණු කිරීමට වියදම් කටයුතුයි."
- "ලංකාවාසී බෞද්ධයිනි, යහපත් චාරිත්‍රධර්මවලට අනුව ක්‍රියාකරන්ට වීර්යය කරව්. නීචයන්ට අයිති ගෝමාංස භක්ෂණය, සූකරමාංස භක්ෂණය, සුරාපානය කිරීම අත්හැර දමා ආර්ය ධර්මවලට අනුව යමින් ශාස්ත්‍ර ශිල්ප, විද්‍යා කර්මාන්ත ඉගෙන ගැනීමට වීර්යය කරව්. සිංහල දරුවන් දඹදිව විශ්වවිද්‍යාලයන්ට යවා හොඳින් ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීමට කටයුතු කරනු ලැබේවා."
- "සිංහල ජාතිය දියුණු කරගත හැකිද? දියුණු කිරීමට කුමක් කළ යුතුද? මේ ගම්භීර ප්‍රශ්න දෙක ස්වජාතිකයන් කෙරෙහි ප්‍රේමයක් ඇති ප්‍රාඥයන් විසින් ඉසිලිය යුතුයි."
- "මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව මේ මහා අනර්ඝ රත්න සතර ආරක්ෂා කරගැනීම මගේ යුතුකමකි. මෙසේ එක එක සිංහලයා විසින් කල්පනාවට ගෙන සතර අගතියෙන් වෙන්ව ක්‍රියා කළ යුතුය."

- "ශාස්ත්‍ර ශිල්ප කර්මාන්ත විද්‍යා ඉගෙනගෙන ජාතිය දියුණු කිරීමට හිතැති සිංහලයන් දස දෙනෙකු සිටිනවා නම් දස වර්ෂයකින් සිංහල ජාතිය නැවතත් ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය වර්ගයක් කළ හැකිය."
- **"සිංහලයනි! සමඟියෙන් ක්‍රියා කිරීමට වීර්යය කරමු. එක්සත්කමින් මෛත්‍රී සිතින් ක්‍රියා නොකළහොත් මතු ඇතිවන සිංහල පරම්පරාවට පරදේසීන්ගෙන් බොහෝ විපත්ති පැමිණෙනවා නිසැකයි."**
- "සිංහල ජනතාව ශ්‍රේෂ්ඨ භූමියට පමුණුවා ගැනීමට අප හැම දෙනාම සමඟිකමින් ක්‍රියා කටයුතුයි. දාන පාරමිතාව පිරීමට සිංහල බෞද්ධයෝ විසින් හිත යෙදිය යුතුයි. අනර්ථයේ වියදම් කරන ධනය ප්‍රඥාව දියුණුවට ද, ශාස්ත්‍ර ශිල්ප කර්මාන්තශාලා පිහිටුවීමට ද යෙදිය යුතුයි."
- "සිංහල බෞද්ධ ජනතාව පිරිහීමට පැමිණ තිබෙන මේ කාලයේ අභිවෘද්ධිය පිණිස අපරිහානීය ධර්ම භාවිතා කටයුතුයි. විශේෂ වශයෙන් ස්ථවිර භික්ෂූන් වහන්සේලා විසින් ගිහිපිරිසට මේ ධර්ම අවබෝධ කරවිය යුතුයි."
- "සත් වැදෑරුම් අපරිහානීය ධර්ම

   1. නිරන්තරයෙන් හෙවත් දවසට තුන් වරක් සන්නිපාත (එක්රැස්) වීම ය.
   2. සමඟිව රැස්වී සමඟිව නැඟීසිටීම, සමඟිව කටයුතු කිරීම, එකක්හුගේ මංගල්‍යයක් හෝ රෝගයක් හෝ අනිකුදු පසුබට වන්නා වූ එබඳු කෘත්‍යයක් හෝ ඇතිවූ විට සියල්ලන්ම හෝ සෙසු තමන්ගේ පුත්‍ර දාරාවන් හෝ එහි යවා හෝ ඔහුගේ කටයුත්තට උපස්ථම්භක වීමෙන් හෝ සහායව තම තමන්ගේ සකල කෘත්‍යයන් සමඟිව කිරීම.

3. පුරාතන නොපවත්වන ලද ප්‍රඥප්ති නොපැනවීම, පුරාණ පටන් පැවතෙන ප්‍රඥප්ති අත්නොහැර පැවැත්වීම.
4. ප්‍රඥා, සීල, වයෝවෘද්ධාදීන්ගෙන් සම්පන්න වූවන්ට සත්කාර, ගරුකාර, පූජාදිය කිරීම. ඔවුන්ගේ වචනවලට ඇහුම්කන් දීම.
5. කුල ස්ත්‍රීන්, කුල කුමාරිකාවන් තර්ජනය කොට අල්වාගෙන ඔවුන් සමඟ වාසය නොකිරීම.
6. පුරාණ චෛත්‍යාදියට සත්කාර ගරුකාර කිරීම, ධාර්මික පූජාදිය පැවැත්වීම.
7. ශ්‍රමණ බ්‍රාහ්මණයන් පැමිණි කල සැපසේ වාසය කරන්නට කටයුතු කිරීම, ඔවුන් ආරක්ෂා ස්ථානයෙහි පිහිටුවීම යන මේ සප්තාපරිහානීය ධර්මයන්ට අනුව ක්‍රියා කිරීමට සිංහල ජනතාව විසින් උත්සාහ කටයුතුයි."

- **"සිංහල ජාතිය දෙමළ, හම්බංකාරයන්ට යටවෙන්ට ඉඩහැරීම සිංහල ලේ ඇත්තවුන් විසින් නොකටයුතුයි. පරදේශීන්ට ඉඩම් ගියොත් සිංහලයන්ට දාසකම් කරන්ට වේවි."**

- **"සිංහලයා වීර්යය නොකොට ශාස්ත්‍රකාරයන්ගේ වචන පිළිගෙන ජන්ම පත්‍රයේ මෙසේ කියා තිබෙනවා ය, ඒ නිසා වීර්ය කිරීම ඕනෑ නැත කියමින් අලසකමින් කල් යවයි. පරදේශිකයා දිවා රාත්‍රී දෙක්හි ම වීර්ය කරයි. වීර්ය නොකරන මනුෂ්‍යයාගේ ජීවිතය ශූන්‍යයි."**

- "සිංහල සහෝදර ස්ත්‍රී - පුරුෂයෙනි ! අපි එක්සත්ව ක්‍රියා කරමු. සමඟිව ක්‍රියා කරමු. සමාදානයෙන් අපේ අභිවෘද්ධියට කටයුතු කරමු ! ආර්ය ඇඳුම, ආර්ය නාම, ආර්ය චාරිත්‍ර, ආර්ය භාෂා මතක නැතිකර නොදමා, නැති වී තිබෙන ශිල්ප ශාස්ත්‍ර ද, වර්තමාන ශාස්ත්‍ර ශිල්ප

ද ඉගෙනගෙන, අන්‍යෝන්‍ය ප්‍රේමයකින්, සාධාරණ-භෝගීව, නැති ඇත්තාට ඇති ඇත්තා උපකාර කරමින්, අපේ ජාතිය, අපේ රට, අපේ ආගම, අපේ භාෂාව දියුණු කරගැනීමට දිවා රාත්‍රී දෙක්හි ම වීර්යය වඩා උත්සාහ කරමු. නිතර නිතර රැස්වීමට සන්ථාගාර ශාලා තනා ගනිමු."

- **"සිංහලයන් කියන්නේ පුදුම ජාතියක්. ඔවුන්ට සේවය කළත් බනිනවා. සේවය නොකළත් බනිනවා. සේවය කළොත් වැඩියෙන් බනිනවා. ඒවාට මුහුණදිය හැකි නම් සිංහලයාට සේවය කළ හැකියි."**
- "දිවා රාත්‍රී දෙක්හි ම සිංහලයන් වීර්ය කළොත් පස් වර්ෂයක් තුළ සිංහල ජාතිය දියුණු අඩියකට පමුණුවාගත හැකිය. සිංහලයිනි, සිංහ වීර්යයෙන් ක්‍රියා කරනු."

## අපේ සිංහල ජනතාව දිනෙන් දින ම පිරිහීමට යෑම

සිංහලයාගේ ධනය පරදේසීන්ගේ භාණ්ඩාගාරවලට යන්නේය. සිංහල ජනතාව එක අතකින් යුරෝපීයයන්ගේ චාරිත්‍ර ගැනීමත්, අනික් අතින් මත්පැන් පානය කිරීමත් නිසා ස්වජාතියට ඇති ප්‍රේමය නැති වී තිබේ. තමා අත තිබෙන ධනය ද පරදේසීන්ට දී දරිද්‍රභාවයට පැමිණෙන්නේය. සාමාන්‍ය සිංහල ජනතාව ක්‍රමයෙන් පිරිහෙන්නේය. විශේෂයෙන්ම සිංහල බෞද්ධ ජනතාව ඇතැම් භික්ෂූන්ගේ උපේක්ෂාව, කුසීතකම, හීනවීර්යය නිසා බුදුදහම නොදැනීමෙන් ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාව නොමැත්තෙන් මිත්‍යාදෘෂ්ටීන්ට ගොදුරු වන්නේය. ධන උපයන මාර්ගය නොදන්නා බැවින් තමන් අත තිබෙන වස්තුව අඩු වන්නේය.

සිංහ ලේ ඇති උතුම් ආර්ය වංශයට අයත් ආර්යවතියේ ජනපදයකින් නික්මුන නිර්භීත සිංහල ජනකායකින්

පැවතෙන්නා වූ පරම්පරා හැත්තෑවක් සිංහනාද කරමින් සිටි සූර සිංහලයන්ට වාසභූමිය වූ මෙම තම්බපණ්ණි ද්වීපය හෙවත් සිංහල ද්වීපය අපේ උතුම් බුද්ධාගම නිර්මලව පවතින අසහාය රට වේ. එහෙත් අපගේ උතුම් ජාතිය දවසින් දවස පිරිහීමට යන්නේය. පූර්වකාලීන සිංහලයන් විසින් නොකරන ලද පව් වර්තමාන සිංහලයන් විසින් කරනු ලැබේ. පරදේශවලින් මෙහි පැමිණි අනාර්ය මිත්‍යාදෘෂ්ටික පාපීන් සේවනය භජනය පයුරුපාසනය කිරීමට පටන්ගත් තැන් පටන් උතුම් සිංහල ජාතිය පිරිහීමට පටන් ගත්තේය. දැනට අප ඉතාම පහත් ගතියකට පැමිණ සිටින බව ප්‍රත්‍යක්ෂයි. ලෝකයේ අනිකුදු ජාතීන් දියුණුවන මේ කාලයේ අප පමණක් පිරිහීමට යන්නේ මන්ද?

**ලංකාවේ සිටින අනික් පරදේශික ජාතීන් අපේ අභිමුඛයේදී ක්‍රමයෙන් විපුල භාවයට පැමිණ සිටින බව නොපෙනෙන්නේ මන්ද?** අපේ දියුණුවට වැඩ කරන පරාර්ථකාමී අනුකම්පා ඇති ගුරුවරු ද දුර්ලභයි. ජනහිතකාමී දයා සම්පන්න අපේ ජාතියට ද, අපේ රටට ද හිතැති ප්‍රධානයින්වත් ධන සම්පත් ඇති නිර්ලෝභී ත්‍යාගවතුන්වත් අප අතර නැති බැවින් සිංහල ජනතාව පිරිහෙන්නේය.

අපේ ශිල්ප කර්මාන්ත විද්‍යා ශාස්ත්‍රාදිය අන්තර්ධාන වීමට හේතු පැමිණ තිබේ. සිංහලයිනි! විෂඝෝර සර්පයන් වටකරගෙන සිටින අපේ ගැලවීම ගැන කල්පනා කරනු මැනවි. සිංහලයිනි! මත්පැන් බොන්ට පුරුදු කරන මිථ්‍යාදෘෂ්ටීන්-ගෙන් සහ කිසි දයාවක් අනුකම්පාවක් නැති මන්ත්‍රීන්ගෙනුත් බේරෙන්ට උපා යොදනු. අප ජාතිය නැතිවීමට බීම හේතු වී තිබේ. ඒ නිසා මේ පර ජාතිකයින් අප ගෙවල් ළඟ ගෙනත් පුරවන මත්පැන් බොන්ට එපා. මරක්කලයන් දිහා බලනු. උන් මත්පැන් බොනවාද? දේවතාවුන් සරණ යන දෙමළ වර්ගයා දිහා බලනු. උන් ඌරු මස්, හරක් මස් කනවාද? ඉංග්‍රීසින් දිහා බලනු. උන් කොපමණ වීර්යය කොට ධන සපයනවා ද?

තේ, රබර් ආදායම ඉංග්‍රීසින් අතට වී තිබේ. වෙළඳාම මරක්කල, දෙමළ ජාතීන් අතට පත්වී තිබේ. අප නැති කරන මත්පැන් වෙළඳාම පමණක් සිංහලයන් විසින් කරනු ලබන්නේ මන්ද? කුල වාද, නිකාය වාද නිසා අපේ ගිහි පැවිදි දෙකොටස අතර කිසි සමඟිකමක්වත්, මෛත්‍රියක්වත් නැත.

ඒ නිසා අප්‍රමාදීව අප සියලු දෙනාම සීලයෙහි පිහිටා අපේ ජාතිය, අපේ උතුම් ආගම දියුණු කිරීමට වීර්යය කළ යුතුයි. හරක් මස්, ඌරු මස් කෑම අත්හැර, මෛත්‍රිය වර්ධනය කරමින්, සමඟිය වර්ධනය කරමින්, අපේ දූ පුතුන්ට ශාස්ත්‍ර ශිල්ප ඉගැන්වීමට අනර්ථයේ වියදම් කරන ධනය වියදම් කටයුතුයි.

**සිංහල ජාතියට ජය වේවා!**

**බුද්ධාගම වැජඹේවා!**

# 04

# හෙළ - බොදු දුවා දරුවන්ගේ යහපත පිණිස ම ධර්මපාල ශ්‍රීමතාණන් ලබාදුන් උපදේශ

- "පස් අවුරුදු කාලයේ සිට සිංහල දරුවන්ට බුදුරජාණන් වහන්සේගේ අසමසම චරිතය කියාදීම දෙමව්පිය ගුරුවරුන් විසින් කටයුතුයි. දිනක් පාසා බුද්ධවංශය, චරියාපිටකය, ජාතක ප්‍රකරණ කියවීමෙන් දේවාතිදේව බ්‍රහ්මාතිබ්‍රහ්ම භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අප්‍රමාණ අනේක ගුණ දැනගන්නේය. වර්තමාන ඇතැම් බෞද්ධ ස්ත්‍රී පුරුෂයෝ සම්මා සමුබුදුරජාණන් වහන්සේට භක්තිප්‍රේම ශ්‍රද්ධා ආදර පෙන්වන්නේ නැත. එවැනි දෙමව්පියන්ට ලැබෙන දරුවෝ කාලකණ්ණිභාවයට පත්වී මරණින් මතු නරකයෙහි උපදීම කරත්. පාඨශාලාවල බාලක බාලිකා ශිෂ්‍යයන්ට ජාතක දිනපතා කියවා තේරුම් කරදීම ගුරුවර ගුරුවරියන්ට භාරයි."
- "ම්ලේච්ඡ පරනාම, පරචාරිත්‍ර නොගෙන ආර්ය ධර්මයන්ට අනුව හැසිරෙන්නට, ආර්ය නම් භාවිතයට ශිෂ්‍යයන්ට දිනපතා අවවාද කළයුතුයි."
- "සිගරැට්, දුම්කොළ, මත්වර්ග පානය නොකළ යුතුයි."
- "බෞද්ධයන්ට අයිති දඹදිව මහබෝමැඩ, බරණැස ඉසිපතනාරාමය, රජගහනුවර ගිජ්ඣකූට පර්වතය, ලුම්බිනි උයන, කුසිනාරා නුවර සල් උයන, සැවැත් නුවර ජේතවනාරාමය යන උතුම් රමණීය ස්ථාන දර්ශනය

කටයුතු බැවින් නුඹලා වැඩිවයසට පැමිණුනාම මේ ස්ථාන දර්ශනයට දඹදිව යා යුතුයි.”

- “සැමදාම උදේට හෝ හවසට ශරීරය ජලයෙන් පවිත්‍රකර ගනින්. මෛත්‍රී භාවනාව ඉගෙන ගනින්. පසළොස්වක දින අටසිල් සමාදන් වෙයන්. කම්මැලිව අලසව මොහොතක්වත් ඉන්න එපා. රැස්කරන පින දෙවියන්ට අනුමෝදන් කරපන්.”
- “පාලි, සිංහල, දෙමළ, හින්දි, ඉංග්‍රීසි භාෂා ඉගෙන ගනින්. ශිල්ප කර්මාන්ත, වෙළඳාම ඉගෙන ගනින්.”
- “නුඹ සිටින කාමරය ශුද්ධ කරපන්, ඇඳ පුටු ආදී භාණ්ඩ පිරිසිදුව තබාගනින්.”
- “බද්ධ පර්යංකයෙන් ඉඳගන්ට හැමදාම වීර්යය කරපන්.”
- “හැමදාම පිනට මොකවත් දීපන්. ජාති ආලයෙන්, ආගමට ආලයෙන් හැමදාම උතුම් දෙය කිරීමට වීර්ය කරපන්.”
- “සංඝරත්නයට ආදරය පෙන්නාපන්. සිංහල ජාතිය සහ බුද්ධාගම දියුණුවට නිතරම වීර්ය කටයුතුයි.”
- “මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය, බොජ්ඣංග සූත්‍රය දවසක් පාසා කියවපන්. ධම්මපද පොතෙන් ගාථා ඉගෙන ගනින්.”
- “සිංහල මහාවංශය කියවපන්. විජය කුමාරයා, දෙවනපෑතිස් රජු, දුටුගැමුණු රජ, මහා පරාක්‍රමබාහු රජ, පණ්ඩිත පරාක්‍රමබාහු රජ, විමලධර්ම රජ මේ ශ්‍රේෂ්ඨ රජවරුන්ගේ කථා ඉගෙන ගනින්.”
- “සිංහල ශිෂ්‍යයන් විසින් ආර්ය වත් පිළිවෙත් ඉගෙනගත යුතුයි. ‘වෙය්‍යාවච්ච - අපචායන’ කෘත්‍ය දසපුණ්‍ය ක්‍රියාවට අයිතියි. ආර්ය චාරිත්‍ර වතාවත් කරන්ට බෞද්ධ ශිෂ්‍යයන්ට ඉගැන්වීම යෝග්‍ය කාරණයක් බව භික්ෂූන් විසින් ද දෙමව්පියන් විසින් ද සිතට ගතයුතුයි.”

- "පාඨශාලාවලට යන ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට යහපත් සිරිත් විරිත් උගැන්වීමට ආචාර්යවරුන් විසින් සිතට ගතයුතුය. බාල පරම්පරාව හොඳින් හදාගත්තොත් සිංහල ජාතිය වර්ධනය වීම නියතය."
- "බාල කාලයේ පටන් සිංහල දරුවන්ට ද, කුඩා සාමණේරවරුන්ට ද පවිත්‍රව සිටීමට ඉගැන්වීම කටයුතුයි. අභ්‍යන්තර බාහිර වස්තු පවිත්‍ර කොට තබාගැනීම විශේෂ වශයෙන්ම ඕනෑ කරන්නේය. විශුද්ධි මාර්ගයේ මේ ගැන බොහෝ විස්තර තිබේ."
- "බාල කාලයේදී බෞද්ධ දරුවන්ට පවින් වැළකී සිටීමට අවවාද කිරීම ගුරු - දෙමව්පියන්ගේ යුතුකමකි."
- "බෞද්ධ දරුවෝ පාපීන්ගේ වසයට පැමිණ විනාශ වෙත්. පුරාණ කාලයේ සිල්වත් භික්ෂූන් වහන්සේලා අනුකම්පා සිතින් බෞද්ධ දරුවන්ට කුලදේවතාවුන් මෙන් කටයුතු කළෝය."

# 05

## ගුරුවරුන් විසින් කටයුතු දේ

1. ශිෂ්‍යයන්ගේ දියුණුව සලසන ගුරුවරුන් විසින් දස අකුසලයෙන් වෙන්විය යුතුයි.
2. සිංහල ජාතියට විරුද්ධව කිසි ක්‍රියාවක් නොකළ යුතුයි.
3. පුරාණ සිංහල චාරිත්‍ර, ආර්ය සිංහල නාම, සිංහල කුලධර්ම ප්‍රකෘතිමත් කළ යුතුයි.
4. අපිරිසිදු වස්ත්‍ර ඇඳීම නොකළ යුතුයි. දුම්කොළ, සුරුට්ටු, මත්පැන් නොබිය යුතුයි. හරක් මස් සහ නීච සතුන්ගේ මස් නොකෑ යුතුයි.
5. දේහ ශක්තිය වැඩිවීම පිණිස ශිෂ්‍යයන්ට සරඹ ආදී ව්‍යායාම් ඉගැන්විය යුතුයි.
6. පාඨශාලාවලට පැමිණෙන විට ශරීරය මනාව වැසෙන වස්ත්‍ර ඇඳීමට ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට හුරුකළ යුතුයි.
7. සතියකට වතාවක් ශිෂ්‍යයන් සමඟ පන්සලට ගොස් සිල් සමාදන් විය යුතුයි.
8. සිංහල ජාතියට හිතැතිව ක්‍රියා කිරීමට ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතුයි.
9. සිංහල කර්මාන්ත වැවිලි ආදිය කිරීමට ශිෂ්‍යයන්ට මාර්ගය පෙන්විය යුතුයි.
10. සහෝදර ප්‍රේමයෙන් ක්‍රියා කිරීමට ශිෂ්‍යයන්ට මිත්‍ර ධර්මයෙහි උතුම්කම කියාදිය යුතුයි.

11. සිහියෙන් යුක්තව හැම වැඩ ම කිරීමට ආනාපානසති භාවනා ක්‍රමය ශිෂ්‍යයන්ට කියාදිය යුතුයි.

# 06

## හෙළ කතුනගේ සදාචාර සම්පන්න බව පිණිස ධර්මපාලතුමාගේ උතුම් ඔවදන් මාලාව

ලෝකනායක සර්වඥයන් වහන්සේ ස්ත්‍රී පක්ෂයට වදාළා වූ අවවාද බොහෝ සූත්‍රවල දක්නට ලැබේ. දීඝ නිකායේ සිඟාල සූත්‍රයේ පුරුෂයා විසින් ස්ත්‍රියට කටයුතු දේ ද, ස්ත්‍රිය විසින් පුරුෂයාට කටයුතු දේ ද දක්වා තිබේ. අංගුත්තර නිකායේ බොහෝ සූත්‍රවල විශේෂයෙන් ස්ත්‍රීන්ට දෙන ලද අවවාද දක්නා ලැබේ. සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ ද, බ්‍රාහ්මණ සංයුක්තයේ ද, මාතුගාම සංයුක්තයේ ද ස්ත්‍රීන් විසින් දැනගත යුතු ධර්ම අන්තර්ගතයි. ජාතක කථාවල ස්ත්‍රීන්ගේ ගුණ අගුණ දෙක ම දක්වා තිබේ. ථේරීගාථා, අපදාන, විමාන වස්තු ග්‍රන්ථවල ස්ත්‍රීන්ගේ ගුණ ද, ප්‍රේතවස්තුවෙහි පාපකර්ම කළ ස්ත්‍රීන්ගේ චරිත කථා ද දක්වා තිබේ. මේ ග්‍රන්ථ කියවීම ස්ත්‍රී - පුරුෂ දෙකොටසට ම ප්‍රයෝජනයි.

### ස්ත්‍රීන් විසින් කළ යුතු දේ

1. ස්වාමිපුරුෂයාගේ සුවදුක් ගැන නිතරම සිත යොදවා, අන්‍ය පුරුෂයින් ගැන කල්පනා නොකර පතිව්‍රතා ධර්මය රක්ෂා කටයුතුයි.

2. ස්වාමිපුරුෂයා ගෙදර සිටින විට සුවදුක් විචාරා මූණ අතපය ධෝවනය කිරීමට ජලය තබා හෝ අනුන් ලවා තබවා පිරිසිදු තුවායක් මූණ පිසීමට දී ආහාර පිළිගැන්විය යුතුයි.

3. ගේ දොර පිරිසිදුකර තැබීම, ලී බඩු, වීදුරු බඩු ආදිය දිනපතාම පිරිසිදුකර තැබීම, මකුළුදැල් කැඩීම, වත්තේ තිබෙන කොළ, මුල් ආදිය උදුරා දම්මවා කැලෑව ශුද්ධ කිරීම, තමන් පාවිච්චි කරන සියලු දේ පවිත්‍ර අන්දමින් තබා ගැනීම, කුස්සිය නොහොත් ගිනිහල්ගෙය පිරිසිදුව තබා ගැනීම, වැසිකිළිය නිතරම පිරිසිදු කමින් තබා ගැනීම, එහි භාජනයක නිතරම වතුර පුරවා තැබීම, පිත්තල පහන් ආදිය ඔප දැමීම, තමන් ළඟ සිටින දාසකම් කරන ඇත්තන්ට මව් ප්‍රේමයෙන් ක්‍රියා කිරීම, ඔවුන්ගේ සුවදුක් විචාරීම, ඔවුන් අඳින වස්ත්‍ර ඔවුන් ලවා ම පවිත්‍ර කරවීම ආදිය ස්වාමි දියණිය විසින් කළයුතු වේ.

4. ස්වාමි පුරුෂයාට ප්‍රථම අවදි වී මූණ අතපය ශරීරය පිරිසිදු කරගෙන, වැඩකාරයන් ලවාත් එසේ කරවා, ඒ ඒ කෘත්‍යවල යොදවා, නැවත ස්වාමිපුරුෂයාට ඕනෑ කරන දේ සම්පාදනය කර දී තමන් කා බී පසු ස්වල්ප වේලාවක් විවේකීව හිඳ බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිකර 'ඉතිපි සෝ' පාඨය ද, 'ස්වාක්ඛාතෝ' පාඨය ද, 'සුපටිපන්නෝ' පාඨය ද කියා තුනුරුවන් වැඳ පන්සිල් ගෙන පවින් වෙන් වීමට පොරොන්දු වී දෙවියන් සහිත සියලු සත්වයන්ට පින් දී නැගිටිය යුතුයි. දරුවන් ඇති මවක් නම් දරුවන් සමඟ බුදුන් වැඳීම කළ යුතුයි.

- හැම ගෙදරකම සුවඳ මල් වැවිය යුතුයි. ඉඩම් කෑල්ලක් නැත්නම් මල් පෝච්චිවල මල්ගස් පැළකර තැබිය යුතුයි.
- උපෝසථ දිනවල අටසිල් රැකීම දුෂ්කර යයි නොසිතා පුරුදු කළයුතුයි. සතියකට වරක්වත් ධර්මය ඇසිය යුතුයි.
- දෙවේලේ පන්සිල් සමාදන්වීම, සුවඳ දුම් දී තමන් සිටින ගෘහය ශ්‍රී කාන්තාවගේ වාසභූමියක් කළ යුතුයි.
- පිණ්ඩපාතයේ වඩින භික්ෂූන් වහන්සේලාට දිනපතා නොවරදවා ම පිණ්ඩපාතය පූජා කළ යුතුයි. දිනපතා

ම හාල් මිටක් හෝ යම් මුදලක් ශාසනික කටයුතුවලට වෙන්කළ යුතුයි.

- ස්වකීය නෑදෑ මිත්‍රාදීන් මතක නැති නොකර ඒ ඇත්තන් බලන්න යා යුතුයි.
- ගිනි තැපීම නොකළ යුතුයි. දහවල් කාලයේ නිදා නොගත යුතුයි.
- අඳින හැට්ටය තමන්ගේ පයෝධර, බඩ සහ පිට සම්පූර්ණයෙන් වැසෙන සේ ඇඳිය යුතුයි. තමන් අඳින වස්ත්‍ර කිලුටු වෙන්ට ප්‍රථම සෝදාගත යුතුයි.
- දස රියන් දිග රෙද්දකින් ඔසරිය ඇන්ද යුතුයි. ගැහැණු දරුවන්ට සිත් ප්‍රිය කරවන ඔසරිය ඇඳීමට නියම කළ යුතුයි. කොට ගවුම්, කොට හැට්ට ඇඳීම අත්හැරිය යුතුයි.
- මිනිසුන් ඉදිරියේ හිස පීරමින්, උකුණන් බලමින් නොසිටිය යුතුයි. තමන් නිදන කොට්ට, රෙදි ආදිය මිනිසුන් යන එන මං මාවත් අද්දර වේලෙන්ට නොදැමිය යුතුයි.
- ළමයින්ට කථා කරන විට යකා, යෝදයා, පෙරේතයා, නොදකින් ආදී වචන නොකියා ආදර වචනවලින් ආමන්ත්‍රණය කළ යුතුයි.
- වැඩ නැති කාලයේ නින්දට නොගොස් තමන්ට ප්‍රයෝජනවත් පොතක් හෝ පත්‍රයක් කියවීම යුතුයි.
- බාල කාලයේදී දරුවන්ට ශාස්ත්‍ර ඉගැන්වීම, ධර්මය ඇසීමට පන්සල්වලට එකතුකරගෙන යාම, මල් පූජා කරවීම, අයුතු දේ ගැන කිසිකෙනෙකුන්ට භයවෙන්නට එපා යැයි ඉගැන්වීම, සතුන්ට ආදරය පෙන්වන්නට ඉගැන්වීම, පිරිසිදුව සිටීමට ඉගැන්වීම අලසව නොසිට වීර්යය කිරීමට ඉගැන්වීම, තමන්ගේ ආගම සහ ජාතිය ආරක්ෂා කරගැනීම සහ වැඩිමහලු අයට ගරු කිරීමට

ඉගැන්වීම ආදී දරුවන්ගේ යහපතට හේතුවන ක්‍රියා කළ යුතුයි.

- ස්වකීය දරුවන්ට සිංහල නම් මිස පරදේශීය නම් නොතැබිය යුතුයි.
- මුළුතැන්ගෙය, වැසිකිළි, කාණු ඉතා පිරිසිදුව තබාගත යුතුයි. ඌරන්, කුකුළන් ආදී නීච සතුන් ගෙදර ඇතිකිරීම සුදුසු නැත.
- ධර්මය දැනගැනීම සඳහා මිළින්ද ප්‍රශ්නය ද, සද්ධර්මාලංකාරය, පූජාවලිය, ජාතක පොත් වහන්සේ, ධර්මප්‍රදීපිකාව බෞද්ධ ස්ත්‍රීන් විසින් භාවිතා කටයුතුයි. මනාකොට ධර්මය දැනගත් උපාසිකාවන් ඇතිවූ කල බාල පරම්පරාව සීලාචාර ධර්මයෙහි පිහිටීම කළ හැකියි.

# 07

## ධර්මපාලතුමාගේ අමද්‍යප සටන

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා පහළ වූයේ ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සිය ආදායම වැඩිකර ගැනීම පිණිස, ගමක් ගමක් පාසා තැබෑරුම් විවෘත කරමින් මද්‍යසාර භාවිතය වැඩි කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුගයකදී ය. එමෙන්ම අබිං හා ගංජා භාවිතය, එම ද්‍රව්‍යයන් සීමාවෙන් තොරව ආනයනය කිරීම හේතුවෙන් සමාජ පිළිලයක් වෙමින් පැවතුණා වූ ද අවධියක ය. මේ බව එවකට ලංකා ආණ්ඩුකාර විලියම් ග්‍රෙගරි විසින් ම 1875 ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයට කරන ලද පහත රාජාසන කථාවෙන් මනාව පැහැදිලි වේ. "ඉංග්‍රීසි පාලනය, ලක්වැසියන් විසින් පිළිගනු ලබන රටට හිතකාමී හොඳ ක්‍රියාවන් කර ඇතත්, තරාදියේ වැඩි බරක් දක්වන ශාපයක් ද ඒ සමඟ ම ව්‍යාප්ත කර ඇත. එනම්, බේබදුකමයි. වසර කිහිපයකට පෙර බේබදු උඩරටියෙකු දුටුවොත් ඔහුගේ සහචරයන් විසින් ඔහු පරිභවයට ලක් කෙරේ. වර්තමානයේ බේබදුකම කොතරම් ව්‍යාප්ත වී තිබේද කියහොත් එය සාමාන්‍ය දෙයක් ලෙස සැලකේ. කලින් කිසි දිනක අසා නොතිබූ ගම්වලත් බේබදුකම විශාල වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. ගැහැනුන් පවා මද්‍යසාර භාවිතයේ නියැලී සිටිනු පෙනේ."

සිංහල ජාතියේ වැනසී යාමට හේතු වූ එක් ප්‍රධාන සාධකයක් වූයේ බේබදුකම බව වැඩිකල් නොගොස් ම ධර්මපාලතුමාට ඒත්තු ගියේය. ඒ පිළිබඳව මතවාදීව සහ ප්‍රායෝගිකව ජාතියේ පිබිදීමක් ඇති කිරීමට එතුමා සමත්

විය. හික්කඩුවේ සුමංගල මාහිමියන්ගේ අවවාද අනුශාසනා අනුව අමද්‍යපප ව්‍යාපාරය අරඹා ගෙනගිය අවිහිංසාවාදී සටන මුළු මහත් ජනතාව ම වෙළාගත් බවත්, සදාචාරාත්මක සහ සාමාජීය වශයෙන් ඉන් ඇති වූ යහපත අප්‍රමාණ බවත් සඳහන් ය. රටේ ප්‍රචණ්ඩත්වය හා විශේෂයෙන් උසාවිවලට ඉදිරිපත් වූ නඩුහබවල විශාල අඩුවීමක් සිදුවී ඇත.

## මත්පැන් - මත්ද්‍රව්‍ය භාවිතයෙන්, විකිණීමෙන් වළකිමු

**'සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි'** යනුවෙන් සුරාමේරය නොහොත් මත්පැන් බීමෙන් වළකින ලෙස අපගේ ශාස්තෲ වූ බුදුරජාණන් වහන්සේ වදාළ සේක. **මත්පැන් බීම, බොන්ට දීම, විකිණීම, බොන්නන්ට ආධාර කිරීම සම්පූර්ණයෙන්ම අප නිර්මල ශාසනයේ වළක්වා තිබේ. සිංහලයෝ දවසින් දවස පිරිහෙන්නේ බීමත්කම නිසයි.**

- "සුරාමේරය කිරීම මහාසාවද්‍ය (බරපතළ) පාපකර්මයකි. මක් නිසාද? මනුෂ්‍යයා උම්මත්තකයෙක් කරවන බැවිනි. එම නිසා මත්වෙන ද්‍රව්‍ය බීම, අනුන්ට බොන්ට දීම, බොන්නන්ට ආධාර කිරීම, මත්වර්ග පෙරීම, එය තනන ඇත්තන්ට ආධාර දීම, මත්පැන් විකිණීම, විකුණනවුන්ට ආධාර දීම, වැරදි බව භාග්‍යවතුන් වහන්සේ විසින් සංයුත්ත නිකායෙහි අත්තූපනායික ධර්ම පරියායේ දක්වා තිබේ."
- "වර්ෂ 2538ක් කිසිම මත්පැන් වර්ගයක් පානය නොකරමින් සිටි සිංහල ජනකාය නැති කරන්ට කටයුතු කළේ සර්ව සාධාරණ යයි කියනු ලබන ඉංග්‍රීසි ජාතිකයෝ ය."
- "පරදේශික සුද්දා ලංකාවට පැමිණි තැන් පටන් මේ දක්වා ම සිංහලයන් නැතිකිරීමට කටයුතු කරනු ලැබේ. හලාහල විෂ නමැති මධ්‍යපානය වර්ෂ 1801 දී ප්‍රසිද්ධියේ පළමුවෙනි වරට විකුණන්ට පටන් ගන්නා ලදී."

- "මනුෂ්‍යයා උම්මත්තක භාවයට පත්කරන හලාහල විෂ නමැති මද්‍යපානය අසරණ සිංහලයන්ට පොවා සිංහල ජාතිය නැතිකර දමන පරදේශික සුද්දා සිංහලයන්ගේ මිත්‍රරෙකි යි කාට නම් කිව හැකිද? අඥාන සිංහලයිනි, පරදේශික සුද්දා දුන් මත්පැන් බොන්ට එපා!"
- "ලංකාවේ සිංහල ජනයා අතර දිනෙන් දින ම මත්පැන් පානය වැඩිවේගෙන යයි. දුකසේ හම්බකරන ධනය නිරර්ථකයේ වියදම් නොකරන්නට, සිංහලයන්ට අවවාද කරන ලෙස භික්ෂූන් වහන්සේලාගෙන් ඉල්ලා සිටිමි."
- "අහෝ! දවසින් දවස ආර්ය සිංහල ජාතිය හීන භාවයට යන හැටි! දහස් ගණන් තරුණ සිංහලයෝ බන්ධනාගාරවල දුක් විඳිති. රා, අරක්කු බීම වැඩිවෙන තරමට සිංහල ජාතිය විනාශයට යන්නේය."
- "මත්පැන් පානය නිසා සිංහලයෝ දරිද්‍රභාවයට පත්වී දුක් විඳිති. මත්පැන් විකුණන වසල සිංහල ස්වල්ප දෙනෙක් කලකට ලෞකික සැප විඳීම කරනු ලැබේ. මරණින් මතු නරකයෙහි ඉපිද ඔවුනට ලෝහගුලි ගිලින්ට වීම නිශ්චිතයි."
- "රා බොන්නා උගුඩුවෙකි. වසලයෙකි. වසල සූත්‍රයේ සඳහන් අන්දමට මත්පැන් පානය කරන්නා ද, කරවන්නා ද වසලයන් හැටියට දක්වා තිබේ."
- "නුඹලා විෂ බී දුකට පත්වීමෙන් නුඹලාගේ දරුවන්ට මහා අන්තරාය වන්නේය. මේවා ගැන කල්පනා කර හලාහල විෂ නමැති මද්‍යපානය බීම අත්හැරිය යුතුමය."
- "සිංහලයන්ට විෂ මත්පැන් බොන්ට දී සිංහලයන් නැති කළ සුද්දා අපේ පරම්පරා සතුරන් ලෙස මම දකිමි."
- "අප ජාතිය නැතිවීමට මත්පැන් බීම හේතු වී තිබේ. ඒ නිසා මේ පරජාතිකයන් විසින් ගෙනත් අප ගෙවල් ළඟ පුරවන මත්පැන් බොන්ට එපා!"

- "චණ්ඩාල සිංහලයා රා - අරක්කු බොමින් අනර්ථයේ කාලය ගතකරති. කවදා සිංහල මෝඩයාට ප්‍රඥාව ලැබේද? පණ්ඩිත සේවනය නැතිකමින් සිංහලයා පිරිහීමට යන්නේය."
- "සිංහලයිනි, මත්පැන් පානය කිරීම අත්හැර දමා ජාතිය වර්ධනය කිරීමට ක්‍රියා කරව්."
- "සුරුට්ටු, සිගරැට්, දුම්කොළ, මත්වර්ග පානය නොකට යුතුයි."
- "රා, අරක්කු, යුරෝපීය මත්පැන් විකිණීම කරන සිංහලයිනි, සිංහලයින් මරණයට පත්කරන ඒ වෙළඳාම අත්හැර දමා සම්‍යක් ආජීවයට අයිති ධාර්මික වෙළඳාම් කරනු. නා නා ශිල්ප ශාස්ත්‍ර වාණිජ කර්ම බාල කාලයේ සිට ඉගෙනුම කටයුතුයි."
- "ආර්ය ධර්මය ආශ්‍රය කරන ආර්ය ජාතියට අයිති සිංහල බෞද්ධ සහෝදරයිනි! බුද්ධ වචනය ආදරයෙන් භාවිතා කොට, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මට පිහිට වේවා! යි අධිෂ්ඨාන කොට මත්පැන් නොබීමට දැඩි සිතින් වීර්යය කරනු."

# 08

## ධර්මපාලතුමාගේ විශිෂ්ට ආර්ථික දැක්ම

සිංහලයාට අනන්‍ය වූ කර්මාන්ත සහ කෘෂිකර්මය නංවාලීමට වෑයම් කළ යුතු බවට නිතර උපදෙස් දුන් දූරදර්ශී නුවණකින් හෙබි ධර්මපාලතුමා ඒ සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක විය. ජපන්, ඕලන්ද, ඩෙන්මාර්ක්, එංගලන්ත, ඇමෙරිකා ආදී රටවල සංචාරය කරද්දී, කර්මාන්ත නරඹා අත්දැකීම් එකතු කළේය. 1904 ජූලි මාසයේදී දඹදිව සාරානාත්හි කර්මාන්ත ශාලාවක් ඇරඹීමට ද ක්‍රියා කළ එතුමා ලංකාවට පැමිණ තම සහෝදරයා වූ ඩී. ඒ. හේවාවිතාරණ මහතාගේ ද සහයෝගය ඇතිව අගනා වැඩපිළිවෙළක් ඇරඹීය. යූ. බී. දොළපිහිල්ල මහතාට පේෂකර්ම කර්මාන්තය ගැන හැදෑරීමට ද, වේයන්ගොඩ විජයබාහු මහතාට පිඟන් කර්මාන්තය ගැන හැදෑරීමට ද, බියන්ගොඩ බාලසූරිය මහතාට ගිනිපෙට්ටි කර්මාන්තය ගැන හැදෑරීමට ද ශිෂ්‍යත්ව ලබාදී ජපානයට පිටත්කොට හැරියේය. පුහුණු වී ආපසු පැමිණි ඔවුහු ආරම්භ කළ කර්මාන්ත මඟින් ජාතික ආර්ථිකයේ නව පිබිදීමක් ඇතිවිය. රට පුරා අත්යන්ත්‍ර පෙහෙකම්හල් නව ප්‍රවේශයකින් ඇරඹී අතර, අලියා ගිනිපෙට්ටි කර්මාන්ත ආයතනය ද ආරම්භ විය. ධර්මපාල තුමා රටේ ධනය වර්ධනය කළ හැකි මාර්ග ද, ඒ මඟින් ස්වාධීනව සමෘද්ධිමත් බව ඇතිකරගත හැකි ආකාරය ද හොඳින් අධ්‍යයනය කොට ඒවා ප්‍රායෝගික ක්‍රියාවට ද නැගීය. ධර්මපාලතුමාගේ දර්ශනය ගුරුකොට ගනිත් නම් සිංහල ජාතියට යහපත් ඉදිරි ගමනක් යාහැකි බව ඒකාන්ත ය.

ධර්මපාලතුමා ජාත්‍යානුරාගයෙන් පරිපූර්ණ ආධ්‍යාත්මිකව ලැබූ ශික්ෂණයෙන් ස්වයංජනක සංකල්ප ඔස්සේ මේ දේශය නංවාලීමට අවංකවම ඇප කැප වූ දේශහිතෛෂී ප්‍රාඥයෙකි.

## ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් සහ ශිල්ප ඥානයෙන් යුතු දේශීය අනන්‍යතාවක් උදෙසා ධර්මපාලතුමාගේ හරවත් මඟපෙන්වීම්...

- "ජාතියක් දියුණු කිරීමට ශිල්ප ශාස්ත්‍ර ගොවි කර්මාන්ත, හස්ත කර්මාන්ත. නා නා විද්‍යා එම ජාතියේ බාලක බාලිකාවන්ට ඉගැන්විය යුතුයි."
- "හැම පාඨශාලාවක ම ශිෂ්‍යයන්ට යම්කිසි හස්ත කර්මාන්තයක් ඉගැන්විය යුතුයි. මැහීම, ගෙතීම, රෙදි විවීම, බීරළු ගෙතීම, ගස් සිටුවීම, කෑම පිසීම, වත්ත පිරිසිදු කිරීම, ඇතින් වලක් කපා කුණු කසල එහි දැමීම, මුස්නු (කොසු) බැඳීම, එළවළු කොරටු කිරීම, රටට ජාතියට ආගමට භාෂාවට ඇල්ම ඇතිකිරීම මේවා අපේ ගුරුවරුන් විසින් අවංක ආදරයෙන්ම කළ යුතුය."
- "වාණිජ කර්ම මනු නීතියේ ඉතාම ශ්‍රේෂ්ඨ කර්මයක් මෙන් නියම කොට තිබේ. වාණිජ කර්මය පටන්ගෙන ධන සම්පාදනය කිරීමට සිංහලයන් විසින් ඉගෙන ගත යුතුයි."
- "පුරාණ කාලයේ සිංහල පණ්ඩිතයෝ පොතපතින් නිතරම සිංහලයන්ට ධර්මාවවාද දී තිබෙත්. සුභාෂිතය, ලෝකෝපකාරාදී ප්‍රකරණවල ධර්මාවවාද තිබෙයි. මේ පොත්වල තිබෙන අවවාදවල හැටියට ශිල්ප ශාස්ත්‍ර, ගොවි කර්මාන්ත, වාණිජ කර්මාදිය ඉගෙන ගැනීමට සිංහලයින් විසින් උත්සාහ කටයුතුයි."

- "සමඟියෙන් සමාදානයෙන් එක්සත්ව ක්‍රියා කරන්ට සිංහලයන් විසින් ඉගෙනගත යුතුයි. සිංහලයන්ට අයිති ඉඩම් ප්‍රවේශම් කරගෙන රබර් තේ වැවීමට සමාගම් පිහිටුවාගෙන එකතු වී ක්‍රියා කිරීමට කාලය පැමිණ තිබේ."

- "මනුෂ්‍යයාගේ ජීවිකාව පවත්වාගන්ට ලෞකික ශිල්ප ශාස්ත්‍ර ඕනෑ කරන්නේය. සිංහල බාලක බාලිකාවුන්ට ඕනෑ කරණ ධනය ශිල්ප කර්මාන්ත, විද්‍යා ධනය යි. ජපන් ශිල්පීන් ලංකාවට ගෙන්නාගෙන සිංහල ළමයින්ට ශිල්ප පුහුණු කටයුතුයි."

- "බටපොතුවලින් තනන ද්‍රව්‍යය ප්‍රිය දර්ශනීය කරවීමට සිංහල ශිල්පීන් වීරිය කටයුතුයි."

- "ශිල්ප - කර්මාන්ත, විද්‍යා ඉගෙන ජපන්නු යුරෝපීයයන් පරාජය කළහ. ශිල්ප කර්මාන්ත ගැන කල්පනා නොකරන ජාතිය දුගී වන්නේය."

- "සිංහලයා තමන්ගේ රටේ දාසකම් කරති. ධන උපයන වෙළඳාම් ආදී සියලු ප්‍රයෝජන දේ පරදේසීන් අතට ගොස් තිබේ. ශරීර පෝෂණයට ඕනෑකරන ප්‍රණීත ද්‍රව්‍ය සියල්ල ම සිංහලයන්ට විකිණීම කරන්නේ කවරෙක් විසින් දැයි ඇස් ඇර බලනු."

- "වස්ත්‍රය පවා පිටරටින් ගෙන්නාගෙන අඳින එකම ජාතිය සිංහල ජාතියයි. ධනවත් සිංහලයන්ට ප්‍රඥාව නැති බැවින් ස්වකීය ජාතිය, රට, ආගම, භාෂාව, ශිල්ප ශාස්ත්‍ර දියුණුවට ක්‍රියා නොකරති."

- "මෙරටට ගෙනෙන පිටරට භාණ්ඩ මේ රටේ හදාගැනීමට පුළුවන්කම තිබියදී අපේ ධනය පිටරටට යවන්නට කටයුතු කරන්නේ මන්ද? අපේ කර්මාන්තකරුවෝ වැඩ නැතුව අසරණව සිටිති."

- "පිටරටට යවන ධනය නවත්වා පිටරටින් අප රටට වස්තුව ගෙන්නා ගැනීමට සිංහලයන් විසින් මාර්ග සලස්වා ගත යුතුයි."
- "වෙළඳාම හා ශිල්ප කර්මාන්ත පරදේශිකයන් අතට පත්වී තිබේ. මත්පැන් විකිණීම, දාසකර්ම කොට ජීවිකාව කරගැනීම, මසුන් මැරීම, රා මැදීම ආදී නීච කර්මවල නොයෙදී සම්‍යක් ආජීවයෙන් ජීවිකාව කරගැනීමට සිංහලයන් විසින් උත්සාහ කටයුතුයි. දෘෂ්ටි විපත්ති, ආජීව විපත්ති, සීල විපත්ති හේතු කොටගෙන අපායගාමී වන්නේය."
- "පුරාණ කාලයේ වාණිජ කර්මයෙහි යෙදී සිටි සිංහලයන් නා නා දේශවලට පැමිණ ධන එකතු කළ බව මහාවංසාදී ප්‍රකරණවලින් පෙනේ. සිංහල ස්වල්ප දෙනෙකු හැර වාණිජ කර්මයෙන් ධන සැපයීමට වැඩිදෙනා උත්සාහ කරන්නේ නැත."
- "ශිල්ප ශාස්ත්‍රාදියක් ඉගෙන නොගෙන ධන සම්බ කරන්නේ කෙසේද? ධන හීන පුද්ගලයා කිසි කලක ලොව බබලන්නේ නැත."
- "ජපන් ජාතිය පමණක් ආසියා ජාතීන්ගෙන් දියුණුවට යන්නේ මන්ද? යුරොපීය ශිල්ප විද්‍යා ඉගෙන ගැනීමට ඔව්හු වීර්යය කරති."
- "ජපන් රට වාසීන්ගේ දියුණුවීම කවරක් නිසා වුයේද? නිස්සරණාධ්‍යාශයෙන්, ජාති ප්‍රේමයෙන්, ආත්ම ගෞරවය මුල් කරගෙන ජපන් ශ්‍රේෂ්ඨ උතුමෝ පරදේශීන්ට යටත් වීම දුකක් මෙන් සලකා ධනය ද ආත්මය ද පූජා කොට ගනු ලැබූ වීර්යය නිසා ජපන් රට උත්තම ස්ථානයට පැමිණියේය."
- "ලංකාවේ ස්ත්‍රී පුරුෂයන් ද බාල කාලයේ මෙසේ නා නා ශිල්ප ඉගෙන ගන්නේ නම් ජපන්නු මෙන් දියුණු විය

හැකියි. රෙදි වෙළඳාම හස්ත කර්මාන්ත වෙළඳාම දියුණු කටයුතුයි.”

- “ජපන් රටට සිංහල ගැහැනු පිරිමි ළමයි පණහක් එකවරට පමුණුවා ජපන් බාලක - බාලිකාවුන්ට උගන්වන ශිල්ප කර්මාන්ත ඉගැන්වීම කටයුතුයි.”
- “හස්ත කර්මාන්තයක් නැතිව රටක් වර්ධනය නොවේ. උපදවන වස්තුව ස්වකීය රටේ නොනැවතී අන්‍ය රටවලට යා නම් ඒ රට දුප්පත් වේ. අඳින වස්ත්‍රාභරණවලට සහ අනුභව කරණ ආහාරපානවලට තමන්ගේ වස්තුව පිටරටවාසීන්ට දේ නම් එය බලවත් අඥානකමකි. සිංහලයන්ගේ ස්වභාවය කුලියට බැලමෙහෙවරකම් කරන ගොපල්ලන්ගේ ගතිය මෙනි. තමන්ගේ කාලය ද, ප්‍රඥාව ද, ශක්තිය ද වියදම් කර ලබන ලද යම් මුදලක් ඇත්නම් එය පිටරටවාසීන්ට අයිතිකර දෙති.”
- “මත්පැන් පානය කිරීමාදිය දියුණු වීමෙන් සිංහල ජනතාව කාලකණ්ණිකමින් කල් යවති. පිටරට වීර්යවන්තයෝ මෙහි පැමිණ රටේ තිබෙන ධනය පිටරටට ගෙනයති.”
- “අපේ රටේ වියන පැදුරු නොගෙන පිටරට පැදුරු පාවිච්චියට ගැනීම වැරදියි. අපේ රටේ හදන ලී බඩු නොගෙන පිටරට හදන ලී බඩු ගැනීම වැරදියි. අපේ කර්මාන්තකාරයෝ වැඩ නැතිව අසරණව සිටිති.”
- “සමගියෙන් ක්‍රියා කරමින් අපේ ළමයින්ට ශිල්ප ශාස්ත්‍ර කර්මාන්ත ඉගැන්වීමට බලවත් වීර්ය කටයුතුයි. සිංහල ජාතිය වෙනුවෙන් දිවි පුදන්ට මම සැරසී සිටිමි.”
- “සිංහලයන්ගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා වර්ෂ 20ක් නා නා දේශවල ශිල්ප ශාස්ත්‍ර ශාලා පරීක්ෂා කළෙමි.”
- “ජපන්, චීන, සියම් රටවල ඒ ඒ ජාතීන් දියුණු වේගෙන යන මේ කාලයේ ජාති හිතෛෂී සිංහල ගිහි පැවිදි

ප්‍රාඥයන් ස්වල්ප දෙනෙක් නිස්සරණ අදහසින් අනුකම්පා සිත් උපදවා අසරණ සිංහල දරුවන්ගේ මතු අභිවෘද්ධිය සලකා තමන්ගේ කාලය, ධනය, ඥානය රට වෙනුවෙන් පූජා කළ යුතුයි.”

- “තමන්ගේ වතුවල කපු වවාගෙන කපුවලින් නූල් තනාගෙන වස්ත්‍ර වියාගත යුතුයි. හැම ගෙදරක ම චර්කා (නූල් සදන යන්ත්‍ර) එකක් හෝ දෙකක් තබාගෙන කපුවලින් නූල් තනාගැනීමට සිංහල බෞද්ධ ළමයින් වහාම ක්‍රියා කළ යුතුයි.”
- “හාල්, මුං, කඩල පරදේශීන්ගෙන් ගන්නේ මන්ද? තමන්ගේ කෙත් වතු වවාගෙන තමන්ට ආහාරයට ඕනෑ කරන හාල්, කහ, මිරිස් සියල්ලක් ම ලබා ගැනීමට වීර්යය වැඩිය යුතුයි.”

“නවීන විද්‍යාත්මක සහ තාක්ෂණ දැනුම ලබා ගනු වස් ධර්මපාලතුමා මෙන් දැඩි ලෙස සහාය පළකළ කිසිවෙකු එදා මෙදාතුර පහළ වී නොමැතියි. ලංකාවේ අනාගතය රඳා පවතින්නේ කාර්මික අධ්‍යාපනය මතය යන විශ්වාසය එතුමා තුළ කෙතරම් ප්‍රබල වී ද යත්, අපේ තරුණයන්ට ජපානයට ගොස් එම දැනුම ලබා ගැනීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් සිය පියා ලවා ඇතිකිරීමට එතුමා කටයුතු කළේය.”

- ආනන්ද ගුරුගේ මහතා

# 09

# සමාජ සුබසාධනය පිණිස ධර්මපාලතුමාගේ මඟපෙන්වීම

## ග්‍රාමාරක්ෂක සමාගම් (ග්‍රාම සංවර්ධන සමිති) මගින් කටයුතු වැඩ

- ගමක් නම් ග්‍රාමාරක්ෂක සමාගමක් හෝ මහාබෝධි සමාගමක් හෝ ගම්වාසීන් විසින් පිහිටුවා ගත යුතුයි. ගම්වාසීන්ගේ දියුණුව සඳහා ක්‍රියා කිරීමට ගමේ සාමාජිකයින් විසින් උත්සාහ කළයුතුයි.
- සමාගමේ ප්‍රධාන අනුශාසක තනතුරට ඒ ගමේ සිටින ප්‍රධාන භික්ෂූන් වහන්සේ නමක් පත්කර ගත යුතුයි.
- ගමේ සිටින ගෑනු පිරිමි දරුවන්ට ශාස්ත්‍ර ඉගැන්වීම ද ගම්වාසීන් විසින් පුරුදුකර තිබෙන යම් ශිල්පයක් හෝ කර්මාන්තයක් ඇද්ද එය වැඩිදුරට දියුණුව ද කළයුතුයි.
- අලසකමින් කාලය ගතකරන උදවියට කම්මැලිකමේ ඇති නපුරු භාවය කියාදී ඒ ඇත්තන්ට සමාගම විසින් වැඩ පමුණුවා ඒ වැඩවල යෙදවිය යුතුයි.
- ගම්මුලාදෑනීන් (ග්‍රාම නිලධාරී මහතුන්) ප්‍රමුඛව ගම්වාසී ස්ත්‍රී - පුරුෂ සියලු දෙනාම පසළොස්වක් දින නොකඩවා සිල් සමාදන් වීමටත්, සතියකට වරක් බණ ඇසීමටත් විධාන කටයුතුයි.
- සමාගමට බැඳී සිටින උදවිය සතුන් මැරීම, හොරකම්, පරස්ත්‍රී සේවනය, බොරු කීම, පරුෂ වචන කීම, කේලාම්

කීම, රා - අරක්කු ආදී මත්පැන් බීම, ක්‍රෝධ කිරීම, ඊර්ෂ්‍යා කිරීම යනාදියෙන් වැළැක්වීමට භික්ෂූන් වහන්සේලා සහ ගම්මුලාදෑනීන් විසින් උත්සාහයෙන් ක්‍රියා කළ යුතුයි.

- ගම්වාසීන්ගේ ගෙවල් පිරිසිදුකර තැබීම, මල් වැවීම, වල් වැවී තිබෙන වතුපිටි පවිත්‍ර කිරීම, අන්‍යජාතික සතුරු සෙනඟගෙන් පැමිණෙන අන්තරාය ගැන සාමග්‍රියෙන් ක්‍රියා කිරීම, නැතිවී තිබෙන පුරාණ චාරිත්‍ර ප්‍රකෘතිමත් කිරීම යන මේවා සමාගම් විසින් කළ යුතුයි.
- පාඨශාලාවක්, පුස්තකාලයක්, ක්‍රීඩා භූමියක්, ධර්ම ශාලාවක් ගමක් පාසා ඇතිවිය යුතුයි.

# 10

# භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ලොව පුරා පතුරුවා හැරීම

අනගාරික ධර්මපාලතුමා ලක්දිව පහළ වූ ශ්‍රේෂ්ඨ සිංහල බෞද්ධ ධර්ම දූතයෙකි. දඹදිව බුද්ධගයා බෝමැඩ හින්දු අන්තවාදීන්ගෙන් නිදහස් කරගෙන බොදු අයිතිය සුරක්ෂිත කරලීම පිණිස, හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ ප්‍රධාන අනුශාසකත්වයෙන් මහාබෝධි සමාගම පිහිටුවීය. ඉන්පසු මහාබෝධි නමින් ඉංග්‍රීසි සඟරාවක් ද, සිංහල බෞද්ධයා නමින් සතිපතා පුවත්පතක් ද අරඹා ශ්‍රී සද්ධර්මය පතුරුවා හැරීමත්, ශාසනික කටයුතුත් සිදුකළේය.

ඇමරිකාවේ චිකාගෝ නුවර ජගත් දෘෂ්ටි සම්මේලනයේදී බුදුදහම නියෝජනය කරමින් ධර්මපාලතුමා පැවැත්වූ විශිෂ්ඨ දේශනය පිළිබඳව දෘෂ්ටි සංගම් ඉතිහාසය පොතේ සඳහන් වී ඇත්තේ මෙලෙසිනි. "පුළුල් නලල් තලය පසුකොට පීරා හැරි කෘෂ්ණ වර්ණ වූ කෙටි කේශ කලාපය විසුරුවා, ප්‍රඥා භාවයෙන් හෙබි දීප්තිමත් නේත්‍ර යුග්මය සභාව කෙරෙහි රැඳවීමෙන් තරංග පන්තීන් මෙන් නැගී එන වදන් මාලා අනුව සුරත ලෙලදෙවා මේ පරිසමාප්ත බෞද්ධ නියෝජිතයා කළ මනස්කාන්ත කථාව ඇසූ කවරෙකුට වුවද ඔහු නියම ධර්මප්‍රචාරක වීර පුරුෂයෙකුගේ ප්‍රතිමූර්තියක් බව පෙනී යනවා පමණක් නොව සමස්ත සදාචාර ලෝකයේ බුද්ධ ධර්මය පතුරුවා හැරීම පිළිබඳව සංවිධානය වූ ප්‍රබල බලමණ්ඩලයක ප්‍රභූත්වයෙහි මෙබඳු පුරුෂයෙකු සිටින බව දක්නට ලැබීමෙන් කවරෙකුගේ වුවද සියොලඟ ප්‍රසාදයෙන් රෝමෝද්ගමනය වන්නේය."

- "බෞද්ධ සහෝදරයිනි! දෙවියන් සහිත ලෝකයා විසින් යහපත් යයි ඒත්තු ගත් මේ නිර්මල සම්බුද්ධ ධර්මය ලොව ප්‍රකාශ කිරීම යුතුකමක් යයි සිතා කටයුතු කිරීම මැනවි."
- "අප විසින් දැන් කල්පනා කරන්ට යුතුව තිබෙන්නේ අපට දැන් මනුෂ්‍ය ආත්මය ලැබී තිබෙනවා ය, බුද්ධ ධර්මය විසුරුවා හැරීමට දැන් කාලය ඇවිත් තිබෙනවා ය යනුවෙනි. යුරෝපා ඇමරිකා ආදී අපරදිග දේශවාසීන් නිර්මල බුද්ධ ධර්මය සෙවීමට පටන්ගෙන තිබේ. ඊට සාක්ෂියක් නම් ඒ රටවල බුද්ධ ධර්මය ප්‍රකාශ කිරීමට සංඝයා ඉල්ලා එවා තිබෙන බවයි. ලාංකික බෞද්ධයන් මේ බව සිතට ගත යුතුයි."
- "ඉන්දියාවට බුදුරජාණන් වහන්සේගේ කල්‍යාණ ධර්මය අවශ්‍ය වී තිබේ. මෙම ධර්මය එහි පැතිරවීමෙන් දැනට එහි පවත්නා දේශපාලන ජනසේවක සහ අර්ථ සංරක්ෂණය පිළිබඳව හටගත් වියවුල් විසඳී යනවා ඇත."
- "සිංහල භාෂාව පමණක් කථා කරන්ට, ලියන්ට සමර්ථ වුණාට පණ්ඩිතයකු මෙන් සැලකීම නොහැකියි. මැක්ස්මුලර් පඬිතුමා භාෂා විස්සක් පමණ දැනගත් කෙනෙකි. ප්‍රධාන භාෂා පහක් හයක් දැනගැනීම යුරෝපීය ශාස්ත්‍රඥයන්ගේ ප්‍රවේණි ධර්මයකි."
- "පාලි, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංස යන භාෂා ඉගෙනගැනීම භික්ෂූන් විසින් කටයුතුයි. මේ භාෂා ඉගෙනගෙන බුදුදහම යුරෝපීය භාෂාවලට පරිවර්තනය කිරීම මෙකලට යෝග්‍යයි. ජර්මන් ජාතික ඤාණතිලෝක භික්ෂූන් වහන්සේ පාලි, ජර්මන්, ලතින්, ඉංග්‍රීසි, ප්‍රංශ උගත් කෙනෙකි. පාලි ඉගෙනගෙන ජර්මන් භාෂාවට උන්වහන්සේ සූත්‍ර දේශනා පරිවර්තනය කර තිබේ."
- "අපේ භික්ෂූහු කුසීතකම අත්හැර අප්‍රමාද පදය

මුල්කරගෙන, කාමභෝගීන් මෙන් නොසිට, ආවාස, කුල, ලාභ, ධම්ම මච්ඡරිය ආදියෙන් තොරව ආරද්ධ වීරියෙන්, ශ්‍රද්ධා සිතින් ධර්ම දේශනා කිරීමට උත්සාහ කරත් නම් දෙවියන් සහිත ලෝකයාට සැප ලැබේ."

- "පෙර කාලයෙහි ලංකාවත්, දඹදිවත් අතර බලවත් මිත්‍රකමක් පැවතුනේ ලංකාවෙන් පාද ගමනින් භික්ෂූන් මාන්තෝට්ටෙන් පිටත්ව පැළලුප් නුවර, බෝමැඩ, බරණැස ආදී බෞද්ධ නගරවල වැඩසිටි භික්ෂූන් සමඟ සාකච්ඡා කිරීම නිසයි. සද්ධර්මාලංකාරයෙහි කථාවස්තු කියවීමෙන් පූර්වකාලීන සිංහල භික්ෂූන් වීර්යාධිකව ක්‍රියා කළ බව පෙනී යන්නේය."
- "බ්‍රහ්මයාගෙන් ආරාධනා ලැබුවා වූ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරන්ට පටන්ගෙන භික්ෂු සංඝයාට **"දේසේථ භික්ඛවේ ධම්මං"** යන නියමය කොට වදාළෝ යි. ධර්ම දේශනා කරමින් මනුෂ්‍යයන් සුචරිතයෙහි පිහිටුවීම, මිථ්‍යා දෘෂ්ටිය නැතිකර දැමීම, සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටුවීම භික්ෂූන්ගේ අංගයකි."

**"මතක තියා ගනිල්ලා, කවදා හරි සුද්දෝ මේ රට දාලා යනවා. උන් යන්නේ උන්ගේ දරුවෝ වාගේ කලු සුද්දෝ විසි තිස්දාහක් බෝකළාට පස්සෙයි. ඊට පස්සේ අපේ රට පාලනය කරන්නේ මේ කලු සුද්දෝ. උන් සිංහල භාෂාවට, සිරිත් - විරිත්වලට වෛර කරනවා. උන් උඹලාගේ දරුවන්ටත් උගන්නාවි ජාති, ආගම්, භාෂා භේදයක් එපා කියලා. දෙමළත්, මරක්කලයත්, හම්බයත් එකයි කියලා උන් කියාවි. එහෙම කියලා උන් පන්සල් වටේ පල්ලි හදාවි. උඹලා උඹලා වෙනුවෙන් දියසේන කුමාරයා ඉපදෙන කල් බලා ඉන්නවා. ඉපදෙන්න ඉන්න දියසේනලා තිඹිරිගෙයිදී ම මරා දමන්න මේ කලු සුද්දන්ට පුළුවන් බව මතක තියා ගනිල්ලා."**

## ගිහි දින චරියාව

උදෑසන ම නැගිට දැහැටි විකා (දත් මැද) ස්නානය කර, පිරිසිදු වස්ත්‍ර හැඳ, සඳුන් ආදී සුවඳ ස්වල්පයක් හා මල් ගෙන එහි සුවඳ ආඝ්‍රාණය නොකොට බුදුරදුන්ට පූජා වේවා යි සිතා, ඒ මල් වන්දනීය ස්ථානයක හෝ ගෙයි පිරිසිදු වූ ආසනයක තබා, උක්කුටියෙන් හිඳ, නමස්කාර පාඨය කියා, සරණ සීලය සහ පඤ්ච සීලය සමාදන් වී, නව අරහාදී බුදු ගුණ කියා ස්වල්ප වේලාවක් සුව පහස් ඇති ආසනයක බද්ධපර්යංකයෙන් හිඳ, පිටිකොන්ද කෙලින් තබා, ශරීරය ඍජුකොට හිඳිමින් ඉහළ පහළ ගමන් කරන හුස්මයෙහි සිත පිහිටුවා, ඉහළ යන හුස්ම ඉහළට යන බැව් දනිමි, පහළ යන හුස්ම පහළට යන බැව් දනිමි යනාදියෙන් හිත හුස්මයෙහි පිහිටුවා මේ ආනාපානසති භාවනාව කර, සියලු දෙනාට පින් දී, සියලුදෙනා කෙරෙහි මෛත්‍රී කර, තමා හට ද මෛත්‍රී කර, ගුරු දෙමව්පිය නෑදෑ මිත්‍ර දිව්‍ය බ්‍රහ්ම පිසාචාදී සකල සත්වයන් කෙරෙහි ද මෛත්‍රී පතුරුවා, කරණීයමෙත්ත සූත්‍රය කියා නැගිටිනු.

# 11

## අඩසිය වසක් ධර්මපාලතුමා රට - දැය - සමයට සිදුකළ විශිෂ්ඨ සේවාව

- රජයේ රැකියාවෙන් අස්වී, බ්‍රහ්මචාරී වී, මුළු දිවිය ම රට, ජාතිය, ආගම වෙනුවෙන් කැපකිරීම.
- ඕල්කට්තුමා ආරම්භ කළ සරසවි සඳරැස බෞද්ධ පත්‍රයේ සියලු කටයුතු කිරිම.
- ඕල්කට්තුමා සමඟින් බෞද්ධ අධ්‍යාපනය නඟාසිටුවීමට කටයුතු කිරීම. කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ, ගාල්ල මහින්ද ආදී බෞද්ධ පාඨශාලා විශාල ප්‍රමාණයක් ආරම්භ කිරීම.
- ඕල්කට්තුමා සමඟ ලක්දිව පුරා සංචාරය කරමින්, ජාතිය - ශාසනය නඟාසිටුවීමට ඉවහල් වූ ඕල්කට්තුමාගේ කථා සිංහලට නැගීම.
- බුද්ධගයාවට ගොස් එහි පැවති සංවේග තත්වය දැක, එය හින්දූන්ගෙන් බේරා ගැනීමේ අදිටනින් බුද්ධගයා සටන ආරම්භ කිරීම.
- බුද්ධගයාව බේරාගැනීම පිණිස බුරුම, සියම් ආදී බෞද්ධ රටවලට ගොස් දැනුවත් කිරීම සහ ආධාර ලබා ගැනීම.
- ඒ පිණිස ම 'මහාබෝධි' නමින් බෞද්ධ සමාගමක් පිහිටුවීම, 'සිංහල බෞද්ධයා' නමින් පුවත්පතක් අරඹා "සිංහලයිනි නැගිටිව් - බුද්ධගයාව බේරා ගනිව්" යන හිසින් දැවැන්ත පිබිදීමක් ඇතිකරලීම.

- බුදු දහම ජාත්‍යන්තරයට ප්‍රචාරය කිරීම සඳහා 'මහාබෝධි' නමින් ඉංග්‍රීසි සඟරාවක් ඇරඹීම.
- බුද්ධගයාවේ බෞද්ධ උරුමය පිළිබඳව අධිකරණයට යාම. එහි ඉඩම් කැබැල්ලක් මිලදීගෙන ධර්ම ශාලාවක් තැනවීම.
- රාජගිරියෙන් ඉඩමක් මිළදී ගෙන එහි ලක්දිව ප්‍රථම පේෂකර්ම පාසල ආරම්භ කිරීම. රාජගිරියේ බෞද්ධ පාඨශාලාවක් ආරම්භ කිරීම.
- ලාංකීය තරුණයන් කිහිපදෙනෙකු ජපානයට යවා පුහුණු කරවා, ඔවුන් මඟින් පේෂකර්ම, ගිනිපෙට්ටි, පිඟන්, විසිතුරු මල් සෑදීම ආදී කර්මාන්ත ශාලා ලක්දිව ආරම්භ කිරීම.
- චිකාගෝ නුවර පැවති ජාත්‍යන්තර ආගම් සම්මේලනයේදී බුද්ධාගම නියෝජනය කරමින් විශිෂ්ඨ දේශනාවක් සිදුකර අපරදිග ලෝකයාට බුදු දහම හඳුන්වාදීම.
- ආපසු එන ගමනේදී හොනොලුලු දිවයිනේදී හමුවූ මේරි පෝස්ටර් රොබින්සන් මැතිණියට දහම් උපදෙස් ලබාදීම. පසු කලෙක ශාසනික කටයුතු සඳහා රුපියල් ලක්ෂ ගණනින් ආධාර ලැබුණේ එතුමියගෙනි.
- මේරි පෝස්ටර් නිදහස් ආයුර්වේද ආරෝග්‍ය ශාලාව කොළඹදී ආරම්භ කිරීම.
- මහාබෝධියට යාබද වික්ටර් හවුස් නමැති අගනා ඉඩම මිලදී ගෙන ආනන්ද බාලිකා විද්‍යාලය එහි පිහිටුවීම.
- මහාබෝධි නමින් ඉංග්‍රීසි විද්‍යාලයක් ආරම්භ කිරීම.
- සාරානාත්හි ඉසිපතන මිගදායේ 'මූලගන්ධකුටි' නමින් අලංකාර ගෞරවාන්විත විහාරයක් තැනවීම.
- මදුරාසියේ ගෙයක් මිලදී ගෙන, මහාබෝධි

සමාගමේ ශාඛාවක් පිහිටුවා එහි භික්ෂූන් වහන්සේනමක් වඩාහිඳුවීම.

- ලන්ඩන් නුවර බ්‍රිතාන්‍ය මහාබෝධි සමාගම පිහිටුවා පළමුවරට ඉංග්‍රීසීන්ට බුදු දහම පිළිබඳ දැනුමක් ලබාදීම.
- හිනිදුම් පත්තුවේ වැසියන් ක්‍රිස්තියානි වනු අසා, විශාල ඉඩමක් මිලදී ගෙන එහි මිනිසුන්ට වැඩ දී රබර් වවා, මහාබෝධි නමින් පාසලක් ද පිහිටුවීම.
- පාලි භාෂාව පළමුවරට කල්කටා විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමට කටයුතු සැළසීම.
- පුස්කොළ පොත්වල තිබූ ත්‍රිපිටකය සංරක්ෂණය කොට හොඳ කඩදාසියෙහි මුද්‍රණය කරවාලීම පිණිස අරමුදලක් ඇතිකිරීමට සිය සහෝදර සයිමන් හේවාවිතාරණ මහතාට මඟ පෙන්වීම. (මෙය අලු විහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසු කෙරුණු වටිනා ධර්ම - ශාස්ත්‍රීය සේවාවකි.)
- බෞද්ධ පාඨශාලා රාශියක් ලක්දිව නොයෙක් ප්‍රදේශවල ආරම්භකොට මහාබෝධි සමාගම මගින් පාලනය කරන්නට සැලැස්වීම.
- මහනුවර මේරි පෝස්ටර් සාමණේර ආයතනය පිහිටුවා ධර්මදූත සේවය සඳහා භික්ෂූන් පුහුණු කිරීම.
- පොළොන්නරුවේ මහාබෝධි විශ්‍රාම ශාලාවක් තැනවීම.
- සාරානාත්හි ගම්වැසියන් උදෙසා උසස් පාඨශාලාවක්, නිදහස් ඖෂධ හලක් පිහිටුවීම.
- පන්නිපිටියේ ධර්මපාල විද්‍යාලය පිහිටුවීම.
- දඹදිව වන්දනාවේ යන සිංහල බෞද්ධයන්ට, ලෝවාසී බෞද්ධයන්ට මහත් සැනසිල්ලක් ගෙන දෙන බෞද්ධ මධ්‍යස්ථාන මදුරාසිය, කල්කටාව, බරණැස, දිල්ලිය,

බුද්ධගයා, බොම්බාය, සාංචිය, ලක්නව් ආදී නගරවල ඇති කිරීම.

- විද්‍යෝදය පිරිවෙණේ දියුණුවට නොයෙක් ලෙසින් ආධාර කිරීම.
- තමා සතු සියලු වත්කම් ජාතික - ශාසනික කටයුතු පිණිස පොදු කමිටුවකට පැවරීම.
- එකල ලක්දිව විසූ ශ්‍රේෂ්ඨ නාහිමිවරුන් ඉසිපතනයට වඩමවා උන්වහන්සේලාගේ උපකාරයෙන් ගෞතම බුදු සසුනේ උතුම් පැවිදිබව ලැබීම.
- ඉසිපතන ශුද්ධ භූමියේදී ම ලක්දිව විසූ ශ්‍රේෂ්ඨ නාහිමිවරුන් මඟින් අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබාගැනීම.

# 12

# සිංහල ජාතියේත් - සම්බුද්ධ ශාසනයේත් - ලංකාද්වීපයේත් අභිවෘද්ධිය පිණිස අනගාරික ධර්මපාලතුමාගේ සොඳුරු අපේක්ෂාවන්

- හැම බෞද්ධයෙකු ම උදේ - සවස බුදුන් වැඳිය යුතුය. පොහොය දිනයන්හි විහාරස්ථානයකට ගොස් වන්දනා කළ යුතුය. අටසිල් සමාදන් විය යුතුය.
- හැම සිංහලයෙකු ම අවංක විය යුතුය. දක්ෂ විය යුතුය. සිංහලයන් නිකම් නොසිට වැඩ කළ යුතුය. කෘෂිකර්මාන්තය හා නොයෙක් විද්‍යා ශිල්ප ඉගෙන ගත යුතුය.
- සිංහලයන් පැරණි උතුම් සංස්කෘතිය ආරක්ෂා කරගත යුතුය. නියම සිංහලයා දැක්ක හැක්කේ සිංහල බෞද්ධයෙකු තුළින් ම ය.
- හැම සිංහලයෙකුට ම ජාත්‍යාලය හා ආගමාලය තිබිය යුතුය. හැම සිංහලයෙකු ම තම රටට, ජාතියට, ආගමට සේවය කළ යුතුය.
- සිංහල බෞද්ධයන් මත්පැන් බීමට පුරුදු වී සිටීම ජාතියේ පිරිහීමට ප්‍රධාන ම හේතුව බැවින්, සියලුම සිංහල බෞද්ධයන් මත්පැන් බීමෙන් වැලකී සිටිය යුතුය.
- අසමඟිය සිංහලයන්ගේ පිරිහීමට බොහෝ සෙයින් බලපෑ ඇති හෙයින්, සිංහලයන් නිතරම සමඟියෙන් සිටිය යුතුය.

- සිංහලයන් විදේශීය සිරිත් විරිත් අන්ධානුකරණයෙන් වැළඳ නොගත යුතුය.
- සිංහල නායකයින් නිතරම ආදර්ශමත් විය යුතුය. හැම සිංහලයෙකු ම තම ආත්ම ගෞරවය රැකගත යුතුය.
- ලංකාවේ තිබූ පැරණි ශ්‍රී විභූතිය නැවත ඇතිකර ගත යුතුය.
- භික්ෂූන් වහන්සේලා බහුස්සුත - සිල්වත් අය විය යුතුය. සමඟියෙන් විසිය යුතුය.
- භික්ෂූන් වහන්සේලා ධර්මදූත සේවය සඳහා ලෝකයේ නොයෙක් රටවලට යා යුතුය. ඉංග්‍රීසි, දෙමළ, හින්දි, ජර්මන් ආදී විදේශීය භාෂා කීපයක් දැන සිටිය යුතුය.
- "බුද්ධාගම ලෝකය පුරා පැතිරවිය හැකි එකම රට ලංකාවයි. අවුරුදු 2500ක් වැනි දීර්ඝ කාලයක් බුද්ධාගම රැකගත් එකම ජාතිය සිංහල ජාතියයි."
- "මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව මේ මහා අනර්ඝ රත්න සතරක් මට තිබේ. මේ රත්න සතර ආරක්ෂා කරගැනීම මගේ පරම යුතුකමකි. මෙසේ එක එක සිංහලයා විසින් කල්පනාවට ගෙන සතර අගතියෙන් වෙන්ව ක්‍රියා කළ යුතුයි."
- "මම මේ සියලු වීර්යය කරන්නේ සිංහල ජාතියට ද, බුද්ධාගමට ද ඇති බලවත් කරුණාව නිසයි. සිංහලයිනි! සිංහ වීර්යයෙන් ක්‍රියා කරව්! සමඟියෙන් ක්‍රියාකොට දියුණුව කරා පැමිණීමට උත්සාහ කරව්!"

# 13

# අනගාරික ධර්මපාලතුමා අද සිටියා නම් මෙසේ කියාවී....

මීහරකෝ ගොන් තඩියෝ
මං කීවා නේද තොපිට සියවසකට කලින්
පරසුද්දා නිකම් ම නෑ දාලා යන්නේ
හොරු තක්කඩි කොමිස්කාරයෝ පාවාදෙන්නෝ
රට කරන්ට හරිගස්සා ම යි උන් නම් යන්නේ
එතකොට තොපිත් උන්ට කතිරෙ ගසනවා
මීහරක් රැලක් පුම්බා උඩ අරිනවා
ඇටි කෙහෙල් කාපු රිලව් වාගේ දැන් තොපි
නියෝ නියෝ හිටපිය ගොන් තඩියෝ

සුද්දටත් වඩා වේගයෙන් කළු සුද්ද තොපිව නසනවා
ආරිය සිංහලයා නිවට නියාලුව හිඟමනට ම වැටෙනවා
රටේ තියෙන හැම දෙයක් ම විකුණා උන් විනාස කරනවා
ගෑනු ටිකත් හම්බ රටට වහල්කමට යවනවා
උන් එවනා මුදල්වලින් තොපි බීලා නටනවා

තොපෙ මහණුන්නාන්සේලා තුන් ලොවට උතුම් -
බුදුන්ව අත්හරිනවා
දේශපාලුවන්ගේ පසුපස්සේ බලුකුක්කො වගේ -
නැමී වැටෙනවා
උන්ට අටපිරිකර හොඳටෝම ඇති සල්ලි බාගෙ ලැබෙනවා

ඇට් කෙහෙල් කාපු රිලව් වාගේ දැන් තොපි
නියෝ නියෝ හිටපිය ගොන් තඩියෝ

පාදිලිරාලලා තොපිට මහලොකුවට හැඩට ම පේනවා නේද
තුන්සරණය සම්දිටුවට වඩා දේවමැවිල්ල -
තොපිත් හොඳයි කියාවි
දේවාල ගානෙ ගොහින් යකිනියන්ට බාරහාර දෙනව නේද
මීහරකෝ ගොන්තඩියෝ එහෙනම් දැන් තොපි -
උඩ බලාන නියෝ නියෝ හිටපං

මං කීව නේද ආණ්ඩුවේ රස්සාවල් බලා ඉන්ට එපා
වෙළඳාමක් කර්මාන්ත ගොයිතැන් කරපං කියා
ඒවා දැන් තියෙන්නේ කාගෙ අතේ දැයි බලපං
හම්බයා රජ වෙලා සිංහලයගෙ මච්කුසටත් විද්ද නේද
සිංහල රජකාලෙ ඉඳන් තොපි සතු සියලු ඉඩම් -
උන්ට වික්ක නේද

මීහරකෝ ගොන්තඩියෝ කොත්තු කකා ටීවී එක ම බලාපං
වට්ස්ඇප් වයිබර් ඉමෝ ෆේස්බුක්වල ම කාලෙ නසාපං
බටහිර ඇති වනචර ගති ඇති පදමට පුරුදු වෙලා -
සිංහලකමත් නසාපං
තොපේ බෙලි කපන්ට කඩු ගල ගානා හඬ
තොපිට තාම නෑහෙන්නෙ ඇයි ගොන්තඩියෝ

මීහරකෝ ගොන්තඩියෝ දැන්වත් නවත්තපං සුරා බීම
වසා දමා තොපේ සුරාසැල් වෙන රස්සාවක් කරපං
තොපේ දූදරුවෝ වැනසෙනවා -
කැක්කුම නැත්තෙ ඇයි ද මීහරකෝ
මං කියාදුන්න උපදෙස් දැන්වත් පිළිපැදපං
ආයෙ නෑ කියන්ටෙපා මේ වතාවෙ -
තොපි මේවා නොපිළිපැද්දොතිං

බෙල්ලේ ගලක් බැඳගෙන මුහුදට පනින්ට වේවි
මීහරකෝ ගොන්තඩියෝ හනේ හනේ තොපිත් -
සිංහල කියා ද කියන්නේ

තොපි දැන් බොරුවට කියනවා -
මට ආයෙත් තොපේ රටට එන්ට කියා
තොපි ම නේද කෙණෙහිලිකම් සියල්ලක් ම එදා මට කළේ
මීට සියවසකට කලින් මං කීව කිසිත් -
ගණන් ගත්තෙ නෑ තොපි
දැන්වත් සිහිය ලැබගෙන ආරිය සිංහල අභිමානෙ උපදවාගෙන
උතුම් මහාවංසේ නිතර කියෝපං හොඳට දහම ඉගෙන ගනිං
වහල්බවින් නිදහස් වෙන්නට හිතට ගනිං... හිතට ගනිං...

මීහරකෝ ගොන් තඩියෝ තොපි බේරෙන්නේ -
තොපේ සපන්කමක් නිසා නොවෙයි
උතුම් බුදුන්ගේ ආනුභාවෙ නිසාමයි... ආනුභාවෙ නිසාමයි...

**(අනගාරික ධර්මපාලතුමාගේ ලිපි හා කතා ඇසුරෙනි)**

ආශ්‍රිත ග්‍රන්ථ -

- ජාතියේ පියා හෙවත් අනගාරික ධර්මපාලතුමා - ගණේගම සරණංකර නාහිමි (සීමාසහිත එම්.ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම)
- අනගාරික ධර්මපාලතුමා - දැනගතයුතු කරුණු
- ධර්මපාල ලිපි - ආනන්ද ගුරුගේ මහතා
- ධර්මපාල ප්‍රතිරාවය - ආනන්ද ගුරුගේ මහතා
- අනගාරික ධර්මපාල 150 වැනි ජන්මදින සමරු කලාපය (මහාබෝධි සමාගම)

මෙම ග්‍රන්ථ සම්පාදනය කළ උතුමන්ටත් ග්‍රන්ථ ප්‍රකාශකයන්ටත් අපගේ ස්තූති පූර්වක පුණ්‍යානුමෝදනාව වේවා!